# පීඩිත ජනතාවගේ ආදරණීය නායකයා වූ, ඉන්දියානු විප්ලවයේ ශ්‍රේෂ්ඨ නායකයා සහ ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාඕවාදී) දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු වන සහෝදර මලෝජුලා කොටෙස්වරා රාඕ ට විප්ලවීය උත්තමාචාරය !

**මධ්‍යම කාරක සභාව**
**ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී)**

ඉන්දියානු පාලක පංතිය 'සටනක්' ගැන තවත් ව්‍යාජ කථාවක් ගොතා තිබේ, ''බටහිර බෙංගාල ප්‍රාන්තයේ බටහිර මිඩ්නාපූර් දිස්ත්‍රික්කයේ බුරිසෝල (Burisola) ගමට ආසන්න කුෂ්බෝනි (Kushboni) වනයේ පැයක් තිස්සේ ආරක්ෂක අංශ සහ මාඕවාදීන් අතර සිදු වූ බිහිසුණු වෙඩි හුවමාරුවෙන් කිසෙන්ජි ලෙසින් හඳුන්වනු ලබන මාඕවාදී නායක කොටෙස්වරා රාඕ මරා දමනු ලැබිණි.'' 2011 නොවම්බර් 24 'සටනින්' මිය ගිය පුද්ගලයා කිසෙන්ජි විය හැකි යයි ප්‍රකාශ කරන අතරතුරේදී පවා මධ්‍යම ස්වදේශ කටයුතු ඇමති කූට සතුටකින් ප්‍රකාශ කර සිටියේ 'මෙය මාඕවාදී ව්‍යාපාරයට බලවත් පහරක් වන බවයි'. මෙයට දිනකට පමණ පෙර, ''ජංගල්මහල්වල සිටි සහෝදර කිසෙන්ජි රාජ්‍ය ආරක්ෂක බල ඇණි මගින් වට කළද කිසෙන්ජි ඔහුගේ සගයන් සමග පලාගොස් තිබුණි'', යන ව්‍යාජ ප්‍රවෘත්තිය ඔවුහු සැලසුම්ගත ක්‍රමයකට අනුව විසුරුවා හැර තිබුණි. 25 වෙනිද උදෑසන ඔවුහු එය තහවුරු කරමින් සටනේදී මිය ගිය පුද්ගලයා කිසෙන්ජි යයි හඳුනා ගත් බව ප්‍රකාශ කෙරෙන තවත් නිවේදනයක් කළහ. චිදම්බරන්, R.K සින්ග්, CRPF DGP විජේ කුමාර් ලෝකයාට ඔහුගේ මළ සිරුර පෙන්වන්නට පවා බියවී මාධ්‍යවේදීන්ට සිද්ධිය සිදු වූ ස්ථානයට පැමිණීමට ඉඩ නොදුන්හ. සත්‍ය තත්ත්වයට අනුව සිද්ධියෙන් මිය ගොස් තිබුණේ එක් පුද්ගලයෙකි, පොලීසියට සීරුම් තුවාලයක් පවා සිදු නොවිණි. අසල්වැසි ගම්වල ජනතාවගේ ප්‍රකාශයන්ට අනුව සහ විශේෂයෙන්ම වධ දුන් බවට සිරුර මත වූ අමානුෂික ලක්ෂණ, එය සටනකින් සිදුවූවක් නොව යම්කිසි තැනකදී පණ පිටින් අල්ලාගෙන නීති විරෝධීව සහ කෲර ලෙස මරා දැමීමක් බැවින් එයට එරෙහිව සිවිල් අයිතිවාසිකම් සංවිධාන සහ මහජන සංවිධාන ප්‍රකාශන නිකුත් කළහ. රටෙහි අභ්‍යන්තර ආරක්ෂාවට ඇති බලවත්ම තර්ජනය මාඕවාදීන් යැයි ප්‍රචාරය කරමින් සිටි පාලක පංතිය, සෝනියා-මන්මෝහන්-චිදම්බරන්-ප්‍රනාබ්-ජයිරාම් රමේෂ් පාලක කල්ලියේ මෙහෙය වීමට අනුව බටහිර බෙංගාල මහ ඇමති මමටා බනර්ජි සමග කූට ලෙස සැලසුම් කරන ලද රහස් මෙහෙයුමකින් සහෝදර කොටෙස්වාර්ලුව අල්ලාගෙන, ඔහුට අමානුෂිකව වධ දී පසුව මරා දැමූ බව ඉතා පැහැදිලිය.



**සහෝදර මලෝජුලා කොටෙස්වාර්ලු පක්ෂය සහ ජනතාව අතර කොටන්නා, ප්‍රහ්ලාද්, රම්ජි, කිසෙන්ජි, බිමාල් ලෙස ප්‍රසිද්ධ වූහ.**

සහෝදර මලෝජුලා කොටෙස්වාර්ලු කොටන්නා, ප්‍රහ්ලාද්, රම්ජි, කිසෙන්ජි, බිමාල් ලෙස ජනතාව සහ පක්ෂය අතර හොඳින් ප්‍රසිද්ධ, ශ්‍රේෂ්ඨ නක්සල්බාරි කැරැල්ලෙන් පසු පරම්පරාවේ ඉහළම පෙළේ නියෝජිතයෙකි. නක්සල්බාරි සන්නද්ධ ගොවි අරගලය ඉන්දියානු සමාජය ඉමහත් කම්පනයට පත් කළ අතර පීඩිත පංති කණ්ඩායම්වලට සහ පංතිවලට අයත් සියලු ජනතාව ප්‍රබෝධයෙන් නැගිට්ටවූහ. එය ඉන්දියානු ආර්ථිකයේ ස්වභාවය තීරණය කළහ. එය න්‍යාය පත්‍රයට අනුව නැවත වරක් සන්නද්ධ අරගලයක් බිහි කළහ. එය සන්නද්ධ කෘෂි කාර්මික විප්ලවය අක්ෂය ලෙස තබාගෙන නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවීය මාවත ඇරඹූහ.

සහෝදර කොටන්නා නක්සල්බාරි දේශපාලනයේ ආභාෂය ලැබූහ. කරිම්නගර්, අදිලබාද් දිස්ත්‍රික්කවල ගොවි ව්‍යාපාරවල ගිලීගත් ඔහු 'ජගිත්යාල් ජයිත්‍රයාත්‍රා' හි ඉදිරි පෙරමුණේ නායකයෙකු ලෙස නැගී සිටිමින් දැඩි ආරක්ෂාවකින් වටවී තිබුණු රදළවාදයේ පිට කොන්ද බිඳ දැමීය. අන්ද්‍රා ප්‍රදේශ් හි ගොවි ව්‍යාපාරවලට නායකත්වය දෙමින්, ඔහු දන්දකර්ණායාහි ගරිල්ලා ස්ක්වේඩයන්ට මග පෙන්වූහ. ඔහු මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස ඉන්දියාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල විප්ලවීය ව්‍යාපාර පුළුල් කිරීමේ ක්‍රියාවලියෙහි කාර්යයක් වශයෙන් බටහිර බෙංගා-ලයට ගියහ. ඔහු අවසානය දක්වාම ජනතාව සමග මහජන යුද්ධය තුළ රැඳී සිටි අතර ලාල්ගාර්හ් ජනතා කැරැල්ලත් සමග ජනප්‍රියත්වයට පත් විය. රටෙහි සම්පත් කොම්ප්‍රදේරු නිළධාරිවාදී ධනපතියන්ට සහ විදේශීය ඒකාබද්ධ කොම්පැනි වලට පාවා දෙන පාලක පංතියේ ජනතා විරෝධී ප්‍රතිපත්ති වලට එරෙහිව ඔහු ජනතා ව්‍යාපාර ගොඩ නැංවූහ. දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ භූමිකාව පක්ෂ මාර්ගය සංවර්ධනය කිරීමේ සහ විප්ලවීය පක්ෂ අතර සමගිය සාක්ෂාත් කිරීමේදී බෙහෙවින්

ක්‍රියාකාරී විය. පක්ෂයේ නියෝජිතයෙකු වශයෙන් දකුණු ආසියාව තුළ ඉන්දියානු ව්‍යාප්ත වාදීන්ට එරෙහිව මාඕවාදී පක්ෂ අතර එක්සත්කමක් ගොඩ නැගීමේදී ඔහුගේ කාර්යභාරය ඉතිහාසය තුළ සනිටුහන් වී ඇත.

අන්න ඒ නිසයි කොම්ප්‍රදෝරු ධනපති පාලක පංතිය අධිරාජ්‍ය වාදීන්ගේ පූර්ණ සහයෝගය ඇතිව විශේෂයෙන්ම සහෝදර කොටෙස්වාර්ලු ඉලක්ක කොට ඔහුව මරා දැමීමට ලජ්ජා සහගත කුමන්ත්‍රණයකට උදව් කරන ලද්දේ. මේ ඝාතනය එම කුමන්ත්‍රණයේ කොටසකි. තෙලංගානා සිට බෙංගාලය දක්වා ඇවිද්ද ඔහුගේ පාද පෙති ගසා තිබුණි. ඉන්දියාව තුළ නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් ලෝක නිර්ධන පංති සමාජවාදී විප්ලවය ඉදිරියට ගමන් කිරීමේ සිහින දුටු ඔහුගේ ඇස් දෙකින් එකක් (දකුණු ඇස) කෙවෙනිවලින් උගුල්ලා ගලවා දමා තිබුණි. සෑම පරමාණුවක්ම **'විප්ලවය දිගුකල් දිනේවා යන'** සටන් පාඨය ලබා දුන් ඔහුගේ සිරුර පල්පයක් බවට පත් කොට තිබුණි. වෙඩි උණ්ඩ ඔහුගේ සිරුරේ හැම තැනක්ම සිදුරු කොට පෙනේරයක් බවට පත් කොට තිබුණි. සෑම තැනක්ම විවිධ වර්ගයේ තුවාල වලින් හානි සිදුවී තිබුණි. ඔහුගේ හඬ දිගටම පිට වුවද සතුරාගේ ෆැසිස්ට් ස්වභාවය කෘෘර ලෙස නිහඬතාවයේ විය. ජනතාව සඳහා ලිවීමේදී අසිපතක් වන් ඔහුගේ පෑන භාවිතා කළ අතෙහි ඇඟිලි කපා දමා තිබුණි. විදුලි හීටරයකින් ඔහුගේ යටි පතුල් පුළුස්සා තිබුණි. අවසානයේදී ඔවුහු ඔහුගේ මුඛය තුලින් වෙඩි තබා තිබුණෙන් හකු පාඩාව ඉවතට විසිවී, මොළය පිටුපසින් එලියට ඇදී තිබුණි. ඔවුන් විසින් ලියන ලද ව්‍යවස්ථාවට පවා ගරු නොකරමින් ඔවුහු රහසිගත ස්ථානයකට රැස්ව පැය ගණනක් තිස්සේ වද දෙමින් ඉතා බියගුලු සහගත ක්‍රමයකට ඔහුව මරා දැමූහ. නමුත් සහෝදර කොටෙස්වාර්ලු මේ සියල්ල දරා සිටියහ. ඔහු ස්ථිර විප්ලවවාදියෙක් විය. ඔහු සිය ජීවිතයෙන් පවා පක්ෂයේ රහස් ආරක්ෂා කළ, සතුරාට යටත් නොවූ සටන්කරුවෙකි. ඔහු මරණයේ මුහුණ ඉදිරියේදී පවා සතුරාව පරාජය කළ සොල්දදුවෙකි.

සතුරා ඔහුව භෞතිකව වැනසීමෙන් තාවකාලිකව සතුටු වුවද, ඔහු ඇලී සිටි පක්ෂ ක්‍රියා මාර්ගය, එය දියුණු කිරීමට ඔහු යෙදූ නිර්මාණශීලී වෑයම, ඔහුගේ විප්ලවවාදී අරමුණු, පරමාදර්ශ සහ සිහින, ජගිත්යාල් සිට ජංගල්මහල් දක්වා සදාකාලිකවම පුළුල්ව විහිදී පැතිරෙන ඔහුගේ මතකය විනාශ කළ නොහැකිය. ඔහුගේ අරමුණුවල ජීවයෙන් සටන් වදින මහජන විමුක්ති ගරිල්ලා හමුදාවේ (PLGA) සහ ජනතාවගේ හදවත්වලින් ඔහුව ඉවත් කළ නොහැකිය. ඔහු විශ්වාස කළ ඔහුගේ න්‍යායන් සහ පරමාදර්ශ දශලක්ෂ ගණන් පීඩිත ජනතාවගේ හදවත් තුළ දැල්වෙනු ඇත. ඔහුගේ දිගු සහ නොනැවතුන විප්ලවීය ජීවිතය, එකින් එක මහජන බලය ගොඩ නැගීම සඳහා විමුක්ති ප්‍රදේශ පිහිටුවමින් අවසානයේ සමස්ත ඉන්දියාව විමුක්ත කර ගැනීමේ අභිලාෂය වෙනුවෙන් සේවය කළහ.

ජනතාව, ප්‍රජාතන්ත්‍රවාදීහු, බුද්ධිමතුන්, දිවි පිදුවන්ගේ මිතුරන් සහ ඥාතී කමිටුව සහ ඔහුගේ මිතුරන්, ඥාතීන් ඔහුගේ දේහය ජංගල්මහල්වල සිට පෙද්දපාලි දක්වා අසීමාන්තික ආදරයෙන් සහ ගෞරවයෙන් යුතුව රැගෙන ගියහ. පෙද්දපාලිහි දී දහස් ගණන් විප්ලවීය ජනතාව පොලිස් වළල්ල සමග ගැටෙමින් අවමගුලට සහභාගි වී සිය ආදරණීය නායකයාට කඳුලු මුසු උපහාරය පුද කළහ. ඔවුහු ප්‍රාන්ත සහ මධ්‍යම රජය විසින් සිදු කළ ඝාතනය හෙළා දුටු අතර ''විප්ලවය දිගු කල් දිනේවා'', ''කොම්රාඩ් කොටන්නා අමාර් රහී'' (සහෝදර කොටන්නා අමරණීයයි) සටන් පාඨ ගුවනට විසිරුණි. පක්ෂයේ මධ්‍යම කාරක සභාව සිය ගැඹුරු ශෝක පණිවුඩය සැනසිය නොහැකි ලෙස හඬන අතුරතුරේදී පවා සිය පුතු ගිය මග යන්නැයි ජනතාවට කියමින් සිටි මවට සහ පවුලේ සියළු සාමාජිකයින්ට, මිතුරන්ට සහ ඥාතීන්ට යවන ලදි. මධ්‍යම කාරක සභාව සිය ශෝකය ඔහු දිවිපිදූ පසු ශෝකී සයුරේ ගිලී සිටි පක්ෂයේ නිළයන් සමග, විප්ලවීය ජනතාව සහ ඔහුගේ සියළු මිතුරන් සමග බෙදා ගනිමින් දිවුරා ප්‍රකාශ කර සිටියේ ඔහුගේ අරමුණු මස්තක ප්‍රාප්ත වන තෙක් අවසානය දක්වා සටන ගෙන යන බවයි.

## දේශප්‍රේමී සහ ප්‍රගතිශීලී අදහස් වලින් පිරුණු ළමාවිය

සහෝදර මලෝජ්ලා කොටෙස්වාර්ලු, කරිම්නගර් දිස්ත්‍රික්කයේ පෙද්දපාලි නගරයේ 1954 නොවැම්බර් 26 වන දින උපත ලැබීය. ඔහුගේ මව වන මධුරම්මාගේ සහ පියා වූ වෙන්කට්ටයියාගේ දෙවන දරුවා ඔහු විය. ඔහුගේ ළමාවිය සහ උසස් පාසල් අධ්‍යාපනය පෙද්දපාලි වලදී සම්පූර්ණ කළහ. ළමා වියේ සිටම ඔහු දේශප්‍රේමී අදහස් වලින් පිරුණු අයෙකු විය. ඔහුගේ රට ආරක්ෂා කිරීම සඳහා සොල්දදුවෙකු වීමට ඔහුට අවශ්‍ය විය. ඔහුගේ දෙශප්‍රේමී අදහස් ඔහුව RSS දෙසට සමහර දිනයන්හි ආකර්ශණය කරලීය. ඔහු කාකි කොට කලිසම් ඇඳීමට පුරුදුව සිටි අතර සෑම දිනකම **ලාටී** රැගෙන *shakha* වෙත පැමිණියහ. එසේ වුවද දිගු කළක් ඔහු එහි රැඳුණේ නැත. ඔහු ඔවුන්ගේ ජාතිවාදී දේශපාලනය සහ ව්‍යාජ දේශප්‍රේමය අවබෝධ කරගත් අතර එය ඔහුව RSS කෙරෙන් ඈත් කරලීය. උසස් පාසලේ ඉගෙන ගන්නා අතරතුරදී ඔහු NCC වෙත සම්බන්ධවී ආයුධ පුහුණුව ලබා ගත්හ. ළමා වියේ සිටම ශාරීරික යෝග්‍යතාව ගැන විශේෂ අවධානයක් යොමු කිරීමට ඔහු පුරුදුව සිටියහ. දිනපතා ශාරීරික අභ්‍යාස කිරීමට ඔහු පුරුදුව සිටියහ. **ලාටී** භාවිතය පුහුණු වීම සඳහා යෑමටද ඔහු පුරුදු වී සිටියහ.

ඔහුගේ පියාට ප්‍රජාතන්ත්‍රවාදී සහ තාර්කික අදහස් පිහිටා තිබුණි. ඔහුගේ මවට කලින් දරුවන් තිදෙනා අහිමි වූ නිසා ඉතිරි දරුවන් අසීමිත සෙනෙහසින් රැකබලා ගත්හ. ඇයගේ සැමියාට සිය තරුණ සමයත්, සම්පූර්ණ දේපළත් නිදහස් ව්‍යාපාරයේ යෙදීමේදී අහිමිවිය. මධුරම්මා සියලුම දුෂ්කරතා පැමිණිලි කිරීමෙන් තොරව බෙදා හදාගත්හ. ළමයි වැඩෙත්ම පවුල මුහුණ දුන් දුෂ්කරතා **කොටන්නා** කෙරෙහි ගැඹුරු බලපෑමක් ඇති කළහ. ඔහුගේ පියා වියපත් සමයේදී ලිපිකරුවෙකු වශයෙන් සේවය කළ අතර කූට ප්‍රයෝග භාවිතා කර ඔහුව රැකියාවෙන්

නෙරපු රාමා රාඕ වැනි *Velama* ඉඩම් හිමියන්ගේ අධිකාරිය දරා සිටීමට ඔහුට සිදුවිය. මව එළදෙනුන්ගේ කිරි දෙවීමට සහ තණකොළ කැපීමට කුඹුරට ගියහ, මුදවන ලද කිරි සහ කිරි සිය දරුවන්ට කන්නට පවා නොදී විකුණා ලද මුදල් සිය දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැය කළහ, කොටන්නාට මේවා අමතක නොවීය. ඔහු වරින්වර නිවසේ කෘෂිකාර්මික කටයුතු සඳහා සහභාගිවූහ, ශ්‍රමිකයන් සමග මුළු හදවතින්ම මිතුදම් ඇතිකරගත්තේ කුලමල භේද පසෙකට වීසි කර දමමිණි. ඔහුගේ ළමාවිය දුෂ්කරතා මැද ගෙවී ගියේය.

## දේශපාලනයට ප්‍රවේශ වීමට දොරවල් විවර කළ තරුණයා

සියළුම පක්ෂ වලට අයත් දේශපාලන වාතාවරණයක් ඔහුගේ නිවසේ විය, විශේෂයෙන්ම කොමියුනිස්ට්වාදී දේශපාලන සාකච්ඡා ඔහුව ප්‍රගතිශීලී අදහස් කරා මෙහෙයවූහ. නිෂාම් (Nizam) වල රෂාකාර්ගේ (Razakars) ගේ දමරිකකම් ළමයින්ගේ ලේ උණු කළහ. වැඩිහිටියන් සාකච්ඡා කළ හැම දෙයක්ම ළමයින්ට වැටහුණේ නැත. නමුත් දරුවන් මහත් උද්‍යෝගයෙන් යුතුව ඔවුන්ගේ සාකච්ඡාවලට හවුල් වූහ. නිවසට ප්‍රකට ප්‍රගතිශීලී කතුවරුන්ගේ පොත් ගෙනඒමේ පුරුද්දක් ඔහුගේ පියා වෙත වූ අතර ළමයින් සාහිත්‍ය ගැන අවබෝධයක් ඇති අය බවට පත්වූහ. කොටන්නා වඩා ප්‍රගතිශීලීව සිතන්නට පුරුදු වූ අතර ඔහු පීතෘමූලික ක්‍රමයට, රදළ වැඩවසම් නීතිවලට, සමාජ අසමානතාවයන්ට, නරක පුරුදු වලට සහ අනර්ථකාරී දෑවලට වෛර කළහ. ඔහු අවංකබව, අනෙක් අයට ගරු කිරීම සහ සමාජ සාරධර්ම සිය මව්පියන් වෙතින් උගත්හ. ඔහු HSC පළමු පංතියක් සහිතව සමත් කළ බුද්ධිමත් ශිෂ්‍යයෙක් විය. මේ දවස්වල ඔහු බරපතල ලෙස දින 40 ක් පුරා ටයිපොයිඩ් උණෙන් පීඩා විඳි අතර පසුව ඔහුගේ එක් කණක් සදාකාලිකවම අක්‍රිය විය.

ඒ 1969 යි. ඒ **වසන්ත කුණාටුවේ** (Spring Thunder) දවස් විය. ඇත්තෙන්ම එකම මොහොතේ තවත් ගිණිපුපුරක් දැල්විණි. ජයි තෙලන්ගානා (Jai Telangana), අන්ද්‍රා ආපසු යනු (Andhra Go Back) සහ මුල්කි (Mulki) ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු යන සටන් පාඨ ගුවනට නිදහස් විය. අරගලයේ ප්‍රමුඛත්වය ගෙන සිටි ශිෂ්‍යයන් විසින් මේ සටන් පාඨ පළමුවෙන්ම සකස් කරන ලදි. පසුව කම්කරුවන් සහ රැකියා නියුක්තිකයින්ද එක්විය. ව්‍යාපාරය යුධකාමී එකක් බවට පත්විය. 400 කට ආසන්න තරුණයින් ව්‍යාපාරයේදී සිය වටිනා ජීවිත පිදූහ. අපගේ පක්ෂය මෙයට ආරම්භයේ සිටම සහයෝගය දුන් අතර ශක්තියේ හැටියට එයට සහභාගිවූහ. පක්ෂයට ශක්තිය තිබුණේ කොතැනකද, එහි ජනතාව එක්කොට ඔවුන්ට නායකත්වය ලබා දුන්හ. තරුණ කොටෙස්වාර්ලු (මේ කාලයේ පක්ෂය සමග සම්බන්ධකම් නොතිබුණි.) ව්‍යාපාරයට එක්වූ දහස් ගණන් තරුණයින්ගෙන් එක් අයෙක් විය. යුධ ක්‍රියාකාරකම් ගණනාවකටම ඔහු සම්බන්ධ විය. ඒ තෙලංගානා බෙදී වෙන්වීමේ දේශපාලනය විය, ක්‍රමයෙන් කොටන්නා විප්ලවීය දේශපාලනයට අවතීර්ණ විය.

## ආශ්වාදජනක විප්ලවීය ජීවිතයේ පළමු පියවර

සහෝදර කොටන්නා කරිම්නගර්හි පූර්ව සරසවි පාඨමාලාවට එක්විය. මේ පාසලට නක්සල්බාරි සහ ශ්‍රීකාකුලම් හි විප්ලවීය පණිවුඩය ළඟා වී තිබුණි. විප්ලවීය දේශපාලනය ඇසුරුකරන්නට පටන්ගත් කොටන්නා තරුණ විප්ලවවාදී කණ්ඩායමට එක්වූහ. ඔහු පූර්ව සරසවි පාඨමාලාව උසස් ලෙස සමත් වී ගණිතය සඳහා BSc උපාධිය අධ්‍යයනයට ඇතුල්වූහ. මේ වන විටත් ඔහුගේ නිවස බොහෝ විප්ලවවාදීන්හට සෙවන දුන් ස්ථානයක් සහ විප්ලවීය ක්‍රියාකාරකම් සඳහා මධ්‍යස්තානයක් බවට පත් විය.

1972 වන විට නක්සල්බාරි සහ ශ්‍රීකාකුලම් විප්ලවීය උදම් රළ පරාජයට පත්විය. අපේ පක්ෂයේ ආරම්භක නායකයින්ගෙන් කෙනෙකු වූ සහෝදර චාරු මජුම්දර් ද්‍රෝහියෙකු විසින් ලබා දුන් තොරතුරු නිසා කල්කටාහිදී පොලිස් අත්අඩංගුවට පත් වී පුරා දින දෙළහක් තිස්සේ වධබන්ධනයන් ඉදිරියේ නොසැලී සිට දිවි පිදූහ. ඉන්දියාවේ නව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ විප්ලවීය මාවතේ ශ්‍රේෂ්ට නායකයා වශයෙන් ඉතිහාසය තුළ ඔහුව සටහන් විය. 1969-1972 කාලය අතරතුරදී පක්ෂ නායකයින් කිහිප දෙනෙකු වූ සරෝජ් දුත්තා, පංචාදි ක්‍රිෂ්ණමූර්ති, වෙම්පටාපු සත්‍යම්, අදිභත්ලා කෛලාශම්, ඩොක්ටර් දෙවිනේනි මල්ලිකාර්ජුන්, ඩොක්ටර් චගන්ති භස්කාර්, තමාද ගණපති සහ නිර්භීත කාන්තාවන් කිහිප දෙනෙකුවූ නිර්මලා, අන්කම්මා, සහ සරස්වතී සතුරා-ගේ ෆැසිස්ට් ආක්‍රමණය ඉදිරියේ දිවි පිදූහ.

නක්සල්බාරි පරාජයත් සමග පක්ෂය තුළ එය අත්හරින්නන් සහ ද්‍රෝහීන්ගේ සංඛ්‍යාවද වැඩි විය. වාම සහ දක්ෂිණ අවස්ථාවාදී ප්‍රවණතාවයන් පක්ෂය තුළ දෙදරීම් ඇති කිරීමට මූලික විය. කෙසේ හෝ අව්‍යාජ විප්ලවීය බලවේගයෝ ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුවේ (APSC) නායකත්වය යටතේ අවංකවම වාම හා දක්ෂිණ වාදී කණ්ඩායම්වලට එරෙහිව මතවාදී අරගලයක් මෙහෙයවා විප්ලවීය බලවේගයන්, ''අතීතය සමාලෝචනය කර සන්නද්ධ අරගලය දියුණු කරමු'' යන ස්වයං විවේචන ලේඛණය (Self-Critical Report - SCR) යටතේ නැවත එක්සත් කරවීමේ වෑයමක නියැලුණහ. එහි ප්‍රතිඵලයක් ලෙස විප්ලවීය මහජන සංවිධාන ඉදි කිරීමට දොර විවර විය. පක්ෂ නායකත්වය පළමුව ලේඛකයින්ගේ සංවිධානය සහ ඒ කාලයේම විප්ලවීය ශිෂ්‍ය සංවිධානය ඉදි කළහ. එය සිවිල් අයිතිවාසිකම් සංවිධාන ඇති කිරීමට දිරි දුන්හ.

මේ කාලය අතරතුර පක්ෂ නායකත්වය සමග සහ සාහිත්‍ය මිතුරන් සමග කොටන්නා ගේ සම්බන්ධකම් ක්‍රමයෙන් ශක්තිමත් විය. ඔහුගෙ කණ්ඩායමේ ශිෂ්‍ය මිතුරන් සමග ඔහු යුධමය වැඩසටහන් ගෙනගියහ. ඔහුගේ පාසල තුළ පළමු වතාවට 1973 අගෝස්තු 15 රැවටිලි සහගත නිදහස් දිනය සැමරීම වර්ජනය කිරීමේ වැඩසටහන ඔහු ගෙන

ගිය අතර සටන්කාමීව ත්‍රිත්ව වර්ණ ධජය පුළුස්සා දැමූහ. මේ සිදුවීම දිස්ත්‍රික්කය පුරා ශිෂ්‍යයන්ගේ සිත් සතන් තුළ හැඟීමක් ඇති කිරීමට සමත් විය. මේ කාලයේදී විප්ලවීය ක්‍රියාකාරකම් වල නියැලෙන අතරතුර ඔහුව අත්අඩංගුවට පත් විය. මේ සහෝදර කොටෙස්වාර්ලුගේ දිගු විප්ලවීය දිවිය තුළ පළමු අත්අඩංගුවට පත් වීම විය.

## බාධා රහිත විප්ලවීය ගමන් මග

BSc උපාධියේ අවසන් වසර ගත කරන විට සහෝදර කොටෙස්වාර්ලු මුළු දිස්ත්‍රික්කය පුරාම ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී ශිෂ්‍ය ක්‍රියාකාරකම් ක්‍රියාකාශීලීව ඇරඹීමට පටන් ගත්හ. මන්තානි, පෙද්දපාලි කණිෂ්ට පාසල සහ ජම්මිකුන්ටා අදෂ් උපාධි පාසල විප්ලවීය ශිෂ්‍ය මධ්‍යස්තාන බවට පත්විය. වරන්ගාල් හි සාහිත්‍යය සිසුන් සමග තිබූ ඔහුගේ සම්බන්ධතාවයන් මේ වන විටත් දියුණු අඩියක විය. කරිම්නගර් මධ්‍යස්තානයක් ලෙස පැවතුණු සාහිත්‍යමය ක්‍රියාකාරකම් ඉහළ ගියහ. සඟරාවක් වූ 'විද්‍යුල්ලතා' (Vidyullatha) සහ 'මාරෝ' (Maro), 'ජන්ජා' (Jhanjha) සහ 'මාර්ච්' (March) කාව්‍ය සංග්‍රහයන් එළිදැක්විණි. සිවිල් අයිතිවාසිකම් සංවිධාන දිස්ත්‍රික්කය තුළ උපත ලැබූහ. පැරණි තෙලංගානා අරගල කාල සමයේ සිටි සහ මේ වන විටත් අවංකව හුන් ප්‍රගතිශීලී සහ විප්ලවීය බුද්ධිමතුන්, නීතිඥයින් සහ කොමියුනිස්ට්වරුන් සමග සහෝදර කොටෙස්වාර්ලු අතිමහත් සම්බන්ධතාවයන් ප්‍රමාණයක් ඇති කර ගත්හ. ශ්‍රී ශ්‍රී හි 'මහාප්‍රස්තනම්' ඔහු කටපාඩමින් දැන සිටියහ. ඔවුහු නිවසේ වූ ප්‍රගතිශීලී සහ විප්ලවීය සඟරා සඳහා සහ ප්‍රදේශයේ අනෙකුත් විප්ලවීය සඟරා සඳහාත් සම්මාදම් එකතු කළහ. ඔහුගේ මව කියවූ මැක්සිම් ගෝර්කිගේ 'අම්මා' නව කතාවේ ශ්‍රේෂ්ට චරිතයක් ලෙස පාවෙල් විස්තර කළහ. මේ දවස්වල නක්සල්බාරි සහ ශ්‍රීකාකුලම් අරගලවල බලපෑම හැරුණු විට වියට්නාම් විප්ලවයේ සහ ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවයේ බලපෑම් තරුණයින්ට ශ්‍රේෂ්ඨ දෑ විය. සහෝදර කොටෙස්වාර්ලු මේ තරුණ පරම්පාරාවේ ක්‍රියාකාරී නියෝජිතයෙකු විය.

1974 වසරේදී ජාතිවාදී බලවේග විසින් සහෝදර ජෝජ් රෙඩී ඔස්මානියා විශ්ව විද්‍යාලයේදී මරා දමන ලදි. ඔහුගේ දිවි පිදීම ශිෂ්‍යයන්ට මහත් අනුප්‍රාණයක් විය. 1974 ඔක්තෝබරයේදී රැඩිකල්වාදී ශිෂ්‍ය සංගමය (RSU) පිහිටුවන ලදි. 1975 පෙබරවාරි 23 සහ 24 දිනයන්හි එහි (APRSU) පළමු සම්මේලනය හයිද්‍රාබාද්හිදී පවත්වන ලදි. කොටෙස්වාර්ලු මේ සඳහා මහා පරිමාණයෙන් සිසුන් කැඳවන ලදි.

RSU ද ඇතුළුව ප්‍රගතිශීලී සහ විප්ලවවාදී ශිෂ්‍ය සංවිධාන, බුද්ධිමතුන්, පට්ටිපාටි වෙන්කටෙස්වාර්ලු සහ KG කන්නබිරාන් වැනි සුප්‍රසිද්ධ නීතිඥයින් සහ සිවිල් අයිතිවාසිකම් සංවිධාන, විප්ලවීය න්‍යායාචාර්යවරු වූ අදිලබාද්හි (Adilabad) බූමායි (Bhoomaih) සහ කිස්තා ගවුද් (Kista Goud) සහෝදරවරුන්ට මරණ දඬුවම නියම කිරීමේ නඩු තීන්දුව නිෂ්ප්‍රභා කිරීමට විශාල පරිමාණයේ රැළියක් පැවැත්වූහ. සහෝදර කොටෙස්වාර්ලු මෙයට ක්‍රියාකාරීව සහභාගි වූහ. පාලක පංතිය මේ විරෝධය නොතකා එම හදිසි නීතියේ අඳුරු දිනවල 1975 දෙසැම්බර් 1 රාත්‍රියේදී ඔවුන් දෙදෙනාව කෲර ලෙස එල්ලා මරා දැමූහ.

1975 ජුනි 26 හදිසි නීති කාල වකවානුවත් සමග මුළු රටම සිර කඳවුරක් බවට පරිවර්තනය විය. සිවිල් සහ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් තළා පෙළා දමන ලදි. කරිම්නගර් අදිලබාද් සහ වරංගල් යන දිස්ත්‍රික්කවල විප්ලවීය පක්ෂ ක්‍රියාකාරීන් සහ නායකයින් රහසිගතයට ගමන් කළහ. එම අය පොලීසිය විසින් විවිධාකාරයේ වධ බන්ධනයන්ට ලක්කොට සිර කොට තැබූ අය වූහ. වරංගාල් කලාප ඉංජිනේරු පාසලේ සහෝදර සුරාපනෙනයි ජාර්නදන් ඇතුළුව මූර්ලයි මොහාන්, ආනන්ද් රාඕ සහ සුදකාර් යන අය මෙඩාක් දිස්ත්‍රික්කයේ ගිරයිපාලි කැලයේදී ගොතන ලද ව්‍යාජ සටනකින් මරා දමන ලදි. බොහෝ විප්ලවවාදී ලේඛකයින්, කවියන්, කලාකරුවන්, ප්‍රජාතන්ත්‍රවාදී බුද්ධිමතුන් සහ නීතිඥයින් සිර කොට තබන ලදි. එය ඇත්තෙන්ම නක්සල්බාරි පරාජයෙන් පසුව රහසිගතයට ගිය නව පරපුර සඳහා පරීක්ෂණ සමයක් විය. මෙම පරීක්ෂණ සමය ඔවුන්ගේ විප්ලවීය කැපවීම සහ නියැලීම පරීක්ෂාවට භාජනය කරන ලදි. සහෝදර කොටෙස්වාර්ලු එවැනි දුෂ්කරතාවයන් වලට මුහුණ දුන් කෙනෙක් විය.

විසි මසක දිගු ෆැසිස්ට්වාදී හදිසි සමය පක්ෂ ක්‍රියාකාරිකයින් රහසිගත ජීවිතයට යොමු කළහ. ගම්මාන තුළ මහජන පදනම සැකසීමට ඔවුහු ගුරුවරු, ග්‍රාමීය වෛද්‍යවරු මෙන්ම රෙදි සෝදන සහ මදින පුද්ගලයින් ලෙස විවිධ වෙස් ගෙන වැඩ කළහ. කෙසේ හෝ පැවති පීඩනය නිසා ඔවුන්ට කිසිවිටක පක්ෂයේ නියම සම්බන්ධතාවයන් භාවිතා කළ නොහැකි විය. ඔවුහු විවිධ ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දුන්හ. ඔවුන්ගේ දෛනික අවශ්‍යතා පිරිමසා ගැනීමට ඔවුන් සතු පෞද්ගලික දෑ වූ අත් ඔරලෝසු, බයිසිකල් වැනි දේ උකස් කොට හෝ විකුණා මුදල් ලබා ගැනීමට සිදු විය. විප්ලවීය මතවාදීහු ඔවුන්ට ලබා දුන් මුදල් සහ කුඩා ණය මුදල් සකසුරුවමින් භාවිතා කිරීමට ඔවුහු පුරුදුව සිටියහ. කුමන ආකාරයක හෝ ඔවුන් ගැන තොරතුරක් පිටතට කාන්දු වීම ඔවුන්ට මරණය අත්වීම විය. එය එක් අයුරකින් රුසියානු විප්ලවීය පක්ෂය මුහුණ දුන් Stolypin මර්ධනයේ දින මතක් කිරීමක් බඳු විය. සහෝදර කොටෙස්වාර්ලු කිසිකලෙක මර්ධනය හමුවේ යටත් නොවූ අය අතරින් එක් අයෙකු විය. ඔවුන්ගේ විප්ලවීය කැපකිරීම, නියැලීම, අධ්‍යයනය, ඔවුන්ගේ අරමුණු සඳහා වූ කැපකිරීම සහ දිවි පිදීමට සූදානම්ව සිටීම අද පරපුරටද ශ්‍රේෂ්ඨ පරමාදර්ශ වන්නේය. මෙවැනි තත්ත්වයන් යටතේ 'තෙලංගානා කලාප සම්මේලනය' පක්ෂ නායකත්වය විසින් 1977 ජනවාරියේ නාග්පූර්හි උපරිම රහසිගත භාවයෙන් යුතුව සාර්ථකව පවත්වන ලදි. මධ්‍යම සංවිධාන කමිටුව (COC) විසින් 1974 දී ක්‍රමවත්ව සකස් කළ 'විප්ලවීය මාවත' ලේඛණය මේ සම්මේලනය විසින් සම්මත කරන ලදි. මේ සම්මේලනය වාමවාදී උපක්‍රම සමාලෝචනය කොට ප්‍රායෝගික තත්ත්වයන්ට එළඹෙමින් ජනතාව මත පදනම්වූ නිවැරදි උපාය මාර්ගතුළින් ඒවා

ජයගත් හැරුම් ලක්ෂයක් විය. මෙය මත පදනම්ව හදිසි තත්ත්වයේ අඳුරු දිනවල පවා පක්ෂ ක්‍රියාකාරීහු ග්‍රාමීය පෙදෙස්වල සංවිධායකයින් ලෙස එක්වී වැඩකළහ. සිර්සිල්ලා ටාලුක් (Sircilla *taluq*) හි **මරිමාද්ලා** ප්‍රදේශයේ වගකීම් සහෝදර කොටෙස්වාර්ලු වෙත පැවරිණි. ඉන්දිරා ගාන්ධි විසින් 1977 මාර්තු දක්වා දික් කළ හදිසි තත්ත්වය කෙරේ රටපුරා සිව්කොනේ වූ ජනතාවගේ කෝපය පුපුරා හැළිණි.

## සංවිධායකයෙකු ලෙස ජනතාවගේ හදවත් තුළ නොමැකෙන සලකුණක් තැබීම

සිර්සිල්ලා පෙදෙසේ ගොවි සංවිධායකයෙකු ලෙස වගකීම් ලැබූ සහෝදර කොටෙස්වාර්ලු ඉක්මනින්ම අත්අඩංගුවට පත් විය. හදිසි තත්ත්වය දික් කළ දවසේම ඔහු අත්අඩංගුවට පත් වූ අතර එම නිසා ව්‍යාජ සටනකින් ඔහුගේ ජීවිතය විනාශ වීම වැළකිණි. තෙමසක් තුළ ඔහුව ඇප මත නිදහස් කරන ලදි.

හදිසි තත්ත්වයේ අඳුරු දවස්වල ඉන්දිරා රජය විසින් සිදුකළ කෲරකම් ගැන විමර්ශනය කිරීමට විමර්ශන කමිටු කිහිපයක් පිහිටුවන ලදි. ජනතාව විසින් ඇති කළ විරෝධය බලවත් වුයෙන් ඉන්දිරා ගාන්ධිට පවා සිර භාරයට ගැනීමෙන් සැනසෙන්නට සිදු විණි. මෙවැනි තත්ත්වයන් යටතේ රජය ගයිරෙයිපලියි (Girayipalli) සටන ගැන විමර්ශනයට භාර්ගවා කමිටුව පත් කරන ලදි. කලින් මුම්බායි අධිකරණයේ ඉහළ උසාවි විනිශ්චයකරුවෙකු වූ වී.එම් තර්කන්ඩ යටතේ ප්‍රමුඛ පෙළේ නීතිඥයින් සහ බුද්ධිමතුන් නව දෙනෙකුගෙන් යුත් කමිටුවක් PUCL විසින් පිහිටුවන ලදි. 'තර්කන්ඩ' කමිටුව හරහා භාර්ගවා කොමිසමට පෙර එම ප්‍රහාරය ගැන එකතුකරන ලද සාක්ෂ්‍ය තබා ගැනීමට බලවත් පරිශ්‍රමයක් දැරූ රැඩිකල් ශිෂ්‍යයන්ගෙන් කෙනෙකි සහෝදර කොටෙස්වාර්ලු.

නක්සල්බාරි කැරැල්ලෙන් ලබාගත් පාඩම්වල ආලෝකයෙන් 1977 අගෝස්තු නිශ්චිත තත්ත්වයන්ට අනුව නිශ්චිත උපායයන් ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුවේ පසුබිම් ක්‍රියාකාරීත්වය යටතේ සූත්‍රගත කරන ලදි, සමස්ත ප්‍රාන්තය පුරා විප්ලවීය ක්‍රියාකාරකම් ප්‍රවර්තන බලයක් අත් කර ගත්හ. විප්ලවීය ශිෂ්‍ය සංවිධානය මුළු ප්‍රාන්තය පුරාම බලවත් විය. ප්‍රධාන දිස්ත්‍රික්කවල සහ තාලුක් නගරවල සියළුම අධ්‍යාපන ආයතනවල ප්‍රධාන බලවේගය ලෙස විප්ලවීය ශිෂ්‍ය සංවිධානය ඉස්මතු විය.

1978 පෙබරවාරියේදී RSU හි දෙවන ප්‍රාන්ත සම්මේලනය හනුමාකොන්ඩා කණිෂ්ඨ පාසල් භූමියේදී උද්‍යෝගී වාතාවරණයක් යටතේ පවත්වන ලදි. සහෝදර කොටෙස්වාර්ලු පක්ෂයේ නියෝජිතයෙකු ලෙස වත්මන් දේශපාලන තත්ත්වයන් සහ රැවටිලි සහගත මැතිවරණ වර්ජනය තුළ විප්ලවීය සිසුන්ගේ කාර්යභාරය ගැන උද්වේගකර කතාවක් පැවැත්වීය. සම්මේලනයේ ආමන්ත්‍රණයට ප්‍රතිචාරයක් ලෙස සියගණන් ශිෂ්‍යයන් සහ තරුණයන් 'වගාකරන්නාට ඉඩම්' සටන් පාඨය ගිම්හානයේ දියත් කළ 'ගමට යන්න' ව්‍යාපාරය හරහා ගම්මානවලට ගෙන ගියහ. එතැන් පටන් සෑම වසරකම විප්ලවීය සම්ප්‍රදයක් ලෙස 'ගමට යන්න' යන ගිම්හාන ව්‍යාපාරය පිහිටුවණු ලැබිණි. සහෝදර කොටෙස්වාර්ලු ශිෂ්‍යයන්ට සහ තරුණයන්ට දේශපාලන පංති පවත්වා ඔවුන්ව ගම්මානවලට පිටත්කර යැවීම සඳහා ඉමහත් වෑයමක් දැරූහ.

රැඩිකල්වාදී තරුණ ලීගය (RYL) 1979 දී පිහිටවූ අතර පසුව 1981 දී අන්ද්‍රා ප්‍රදේශ් රිතු කූලි සංගම් (APRCS) පිහිටවූ පසු, එකකට පසු තව එකක් පෙනෙන්නට වූහ. ගම්මාන තුළ විප්ලවීය ක්‍රියාකාරකම් තීව්‍ර විය. රදළ අධිපතීන්ගේ ගාඩි (රදළ මන්දිර) තුළ පරම්පරාගණන් ඇපයට බැඳීම නිසා තැලී පොඩිවුණු අඳ ගොවි ජනතාව විප්ලවීය දේශපාලනය සමග සම්බන්ධ වෙන්නට පටන් ගත්හ. තෙලංගානා ඉඩම් හිමියන් යටතේ තැලී පොඩිවුණු පීඩිත ජනතාව අභිමානවත් ලෙස ජීවත් වෙන්නට දිරිදුන් දෙශපාලනය නිසා නිදහසට පත්වූහ. ඉඩම් හිමියන්ගේ මන්දිර (ගාඩි) තුළ නිමක් නැති දමරිකකම් වලට ලක්වී තිබුණු ග්‍රාමීය කාන්තාවන්ට සහය පිණිස විප්ලවීය දේශපාලනය නැගී සිටියහ. ඉඩම් හිමියන්ගේ ඉඩම්, පුරන්වූ ඉඩම් අත්පත් කර ගැනීමට සහ ඉඩම් හිමියන් යටතේ වැඩ කරන කම්කරුවන්ගේ වැටුප් වැඩි කර ගැනීම සඳහා අරගල පැවැත්වූහ. කරිම්නගර් දිස්ත්‍රික්කයේ සෑම ගමක්ම ඉඩම් හිමියන්ගේ අධිකාරියෙන් කැඩී ගියේය. මේ දවස්වල කරිම්නගර් සහ අදිලබාද් යන දිස්ත්‍රික්ක පාලනය කළේ කෲර ඉඩම් හිමියන් විසිනි. ලොතුනූර් රාජේෂ්වරා රාඕ, ඉතික්යලා සත්‍යනාරායන රාඕ, මන්ධමාරි මාධව රාඕ (අදිලබාද් තුළ) අඳ ගොවියන්-ගේ ජීවිත කාලකණ්ණි කළහ. ඒ හැම කෙනෙක්ම මිනීමරුවන් සහ රදළ ඒකාධිපතීන් විය. රැඩිකල්වාදී ශිෂ්‍යයෝ සහ තරුණයෝ පක්ෂයේ නායකත්වය යටතේ ඔවුන් සමග මුහුණට මුහුණලා සිටියහ. දිස්ත්‍රික්කය තුළ ඒකාබකද්ධවුණු ශක්තියේ නායකයින් සහ නියෝජිතයින් අතර සහෝදර කොටෙස්වාර්ලු සුවිශේෂී සහෝදරයෙකු විය.

මෙම ගොවි අරගල වල ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශ වල නිෂ්පාදන සම්බන්ධතාවයන් අරටුව දක්වාම වෙව්ලුම් කෑහ. ප්‍රාන්තය තුළ ප්‍රගතිශීලී අදහස් සහිත ප්‍රජාතන්ත්‍රවාදීහු, විප්ලවීය බුද්ධිමත්තු, නීතිඥයෝ, ගුරුවරු සහ රැකියා නියුක්තිකයෝ මේ අරගලවලට සහය දීම පිණිස නැගී සිටියහ. ප්‍රධාන ප්‍රතිවිරෝධය (වැඩවසම්වාදයට විරුද්ධව) විසඳීමේ කොටසක් ලෙස අති මහත් පීඩිත ජනතාවක් තෙලංගානාවට එක්රැස් වන්නට පටත් ගත්හ. ගුරුවරුන්ගේ සහ රැකියා නියුක්තිකයින්ගේ ෆෙඩරේෂන් ඔවුන්ගේ සැබෑ ඉල්ලීම් වෙනුවෙන් ක්‍රියාකාරීව රැළි පැවැත්වූහ. සහෝදර කොටෙස්වාර්ලුට රැකියා නියුක්තිකයින් සමග ගැඹුරු සම්බන්ධතාවයන් තිබුණා මෙන්ම පක්ෂයේ අවබෝධයත් සමග ඔවුන්ගේ ස්ථාවරයන්ට මගපෙන්වීම සැපයූහ. දිස්ත්‍රික් ඒකක උසාවි ද ඇතුළුව සියලු තාලුක් මධ්‍යස්ථානවල නීතිඥයින් සමග සම්බන්ධතා ගොඩ නගා ගත් ඔහු පක්ෂ ක්‍රියාකාරීන්ගේ සහ ගොවියන්ගේ නඩු ගැන ඉමහත් අවධානයක් යොමු කළහ. සහෝදර කොටෙස්වාර්ලු සියළුම විවෘත ක්‍රියාකාරකම් වලට සහභාගි වී ඒවාට නායකත්වය දුන්හ. ඉක්මනින්ම ඔහුගේ නායකත්වය යටතේ දෙවන පෙළ නායකයින් වූ සායිනයි

ප්‍රභාකාර්, දග්ගු රාජලිංගම්, බායියප්පු දේවෙන්දර් රෙඩ්ඩි (සියලු දෙනාම කලින් දිවි පිදූහ) සහ අනෙක් අය වර්ධනය වී ඉදිරියට ආහ.

## කොටන්නා ඉතිහාසය වෙනස් කළ 'ජගිත්යාල් ජයිත්‍රයාත්‍රා' හි නායකයා ලෙස

1978 සැප්තැම්බර් 9 වන දින මාඕගේ දෙවන මරණ අනුස්මරණය විය. ජගිත්යාල් නගරය දහස් ගණන් ගොවීන්ගෙන් පිරී ඉතිරී ගත්හ. කණිෂ්ඨ පාසල් පරිශ්‍රය ජනතාවගෙන් පිරී ගත්හ. කරීම්නගර්, අදිලබාද් වල ගම්මාන වලින් සහ නිෂාමාබාද් දිස්ත්‍රික්කයේ මායිම් ගම් ඇතුළුව 150 කට වැඩි වූ ගම්මානවලට අයත් ජනතාව ජගිත්යාල් රැස්වීම් භූමිය වෙත පැමිණියහ. ඒ හැම කෙනෙක්ම ඉඩම් සඳහා පැමිණි අයයි. ''වගා කරන්නාට ඉඩම්'' යන සටන් පාඨය ඔවුන්ව එක්රැස් කළහ. ඔවුහු ඉඩම්හිමි වාදයට අභියෝග කළහ. ඔවුහු ඉඩම් හිමියන්ගේ ගාඩි (මන්දිර) තුළ වූ කෲරත්වය අවසන් කිරීම සඳහා සූදානම් වූ ගොවියන් විය. ඔවුහු දුෂ්ට බදු වලට සහ සෑම දිනක්ම දැරිය නොහැකි ලෙස වැඩ කිරීමට බැඳ තිබූ ගොවියන් වූහ. සහෝදර කොටන්නා වේදිකාවේ වාඩිවී සිටි අයගෙන් කෙනෙකු විය. ඔහු එහි සිටි ප්‍රධාන කථිකයින්ගෙන් කෙනෙකු විය. සිය ගණන් ගම්වලින් ඒකරාශී වූ මහා ජන ප්‍රවාහය 'ජගිත්යාල් ජයිත්‍රයාත්‍රා' (ජගිත්යාල් ජයග්‍රාහී පෙළපාලිය) ලෙස ඉතිහාසය තුළ සදකාලික ඉඩක් අත්කර ගත්හ. එම රැස්වීමට පැමිණි මහා සාගරයක් බඳු ජනතාවගේ හදවත් තුළ සහෝදර කොටෙස්වාර්ලු සදතනික ඉඩක් අත් කර ගත්හ.




සහෝදර කිසෙන්ජි මාධ්‍යවේදීන් සමග සම්මුඛ සාකච්ඡාවක.



මාඕවාදී කලාකරුවෙකු වන ගඩාර්, රැස්වීමකදී.

ජගිත්යාල් ජයිත්‍රයාත්‍රා විසින් නිර්මාණය කළ දේශපාලන වාතාවරණය හමුවේ බලසම්පන්න ඉඩම් හිමියන් 60 දෙනෙකුට වඩා සිය ගාඩි අත්හැර නගරයට පළා ගියහ. සිය ගණන් ගම්වල ඉඩම් හිමියන් ගොවි ජනතාව ඉදිරියේ මුනින් ඇද වැටුණි. ගොවීහු ඉඩම් හිමියන්ට 'ඉන්ධන සහ ජලය' ලබා දීම නැවැත්වූහ. ගම්මාන වල ඉඩම්හිමියන් සමාජීයව පිටු දැකීම 'ඉන්ධන සහ ජලය බාන්ද්' ලෙස ප්‍රසිද්ධ වූහ. මෙය ඉඩම් හිමියන්ගේ පාලනයට නතු තැන්වල, ඉඩම් හිමියන්ගේ ආඥාව යටතේ පවත්නා ප්‍රදේශවල දැවැන්ත ලෙස පැතිරෙන්නට වූහ, කලබලකාරී ගොවිජන අරගල ආකාරයක් වූ මෙයට පරම්පරාගත ශ්‍රමයට බැඳ තබා ඉඩම් හිමියන්ගේ පා යට තැලී පොඩිවුණු මාලා, මඩිගා (අන්ද්‍රා ප්‍රදේශ් හි 'හීන කුලයක්'), සෑම කුලයකටම අයත් පීඩිත ජනතාව එකාවන්ව ඉදිරියට පැමිණ ඉඩම් හිමියන් වර්ජනය කළහ. ගම්මානවල ඉඩම් හිමියන්ගේ බිරින්දෑවරුන්ට මිදුල් සහ හරක් ගාල් පිරිසිදු කිරීමට සිදු විය. මුළු නිවසම කොස්සෙන් පිරිසිදු කළ ඔවුහු දහඩියෙන් තෙමී ගියහ. හරකුන්ගෙන් කිරි දෙවීමට, රැවුල බෑමට හෝ රෙදි සේදීමට කිසිවෙක් නොවිය. කිසිවෙක් සී සාන්නට නොසිටියෙන් අක්කර දහස් ගණන් අස්වැද්දූ බිම් පුරන් වූහ. මේ අරගලයෙන් ඇතිවූ නියම තත්ත්වය මෙය විය.

RCS ඉඩම් හිමියන්ට අභියෝග කොට පවුල් නීති සහ ගෝත්‍ර නීති මගින් පවත්වාගෙන ගිය විවිධ පංචායත් (ග්‍රාමීය අධිකරණ) විසින් ගොවියන් මත පටවනු ලැබූ බදු නැවත ඔවුන්ගෙන් ඉල්ලීය. තෙලංගානා ඉඩම් හිමියෝ ප්‍රධාන ඇමති චෙන්නා රෙඩ්ඩිට පැමිණිලි කොට තත්ත්වය පාලනය කිරීම ඉල්ලා සිටියහ. 'රජය' ඇතුල් විය. චෙන්නා රෙඩ්ඩි රජය සිර්සිල්ලා සහ ජගිත්යාල් තාලුක් ගම්මාන බාධාකාරී ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කළහ. ඉඩම් හිමියන්ගේ ගාඩි ආරක්‍ෂා කිරීමට ගම්මාන වලට විශේෂ සන්නද්ධ පොලිස් බලඇණි ඇතුල්වූහ. මේ ක්‍රියාවලිය තුලදී ජගිත්යාල්හි ඉඩම් හිමියෝ ගොවි ක්‍රියාකාරිකයෙකු වන පෝසෙට්ටි මරා දැමූහ. මේ සමගම රාජ්‍ය අනුමැතිය ලත් ප්‍රචණ්ඩත්වය හමුවේ සටන් කිරීමට මගක් නොවුයෙන් ගොවීහු ඉවත්ව ගියහ.

1978 දී පෙද්දපාලි තාලුක් හි රාගනේදු ගමේ ගොවීහු ඔවුන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ ඉඩම් හිමියන් අත්අඩංගුවට ගත්හ. ඒ දිනවල 'රාගනේදු පැහැරගැනීම' ලෙස බලවත් උද්වේගයක් ජනිත කළ මේ සිදුවීම ඉඩම් හිමියන් භීතියෙන් ඇලලීය. සහෝදර කොටෙස්වාර්ලු මෙයට නායකත්වය දුන්හ. ජනතාවගේ අභිලාෂයන්ට අනුව ජනතාවගේ සහභා-ගිත්වයෙන් නව ආකාරයක අරගලය ඉදිරියට ගෙන යෑමට ඔහු ක්‍රියා කළහ. ඔහු බොහෝ අවස්ථාවල එම අරගල ආකාරයන් උපත ලද්දේ ජනතා ව්‍යාපාර හරහා බව තහවුරු කළහ. කාකි බල ඇණි ගම්මාන වට කරන ලදුව සිය පා ඇඟිලි මත ගිනි අවි සිටුවා රැකවලෙහි යෙදෙන වාතාවරණය හමුවේ සහෝදර

කොටෙස්වාර්ලු නැවත වරක් රහසිගතයට ගියහ. නමුත් ඔහු එකම තාලුක් හි රචපාල්ලි ගම අසලදී නැවත වරක් අත් අඩංගුවට පත් වූහ. දින කිහිපයක් තුළදී ඇප මත නිදහස් වූ ඔහු නැවත රහසිගතයට පත්වූහ. පොලිස් ආරක්‍ෂක වළලු වලින් ගැලවී යාමේ තොතෙකුත් නිදර්ශන ඔහුගේ විප්ලවීය ජීවිතය තුළ තිබේ.

මේ වන විට රැකියා විරහිත තරුණයෝ සහ ගොවීහු දිස්ත්‍රික්කයේ බොහෝ ගම්මාන වල වඩා ශක්තිමත් විය. ගුතාපාල සංගම් (ලතී සංවිධානය), ග්‍රාම් රක්‍ෂ දලාම්ස් (ග්‍රාමාරක්‍ෂක ස්ක්වේඩ) වශයෙන් සිය ගණන් වූ ගම්මානවල සංවිධාන පිහිටවූහ. පෙද්දපාලි තාලුක් හි පල්තෙම්, දුන්ගතුර්ති, කුක්කලගුදූර්, රාගනේද්‍ර, බායියාරම්, රාමයියපල්ලෙ, තක්කෙලපල්ලි ගම්මාන තුළ සහ මන්තානි, ජගිත්යාල්, කොරුත්ලා, මෙත්පල්ලි, හුෂුරාබාද්, හුස්නාබාද් යන තාලුක්වල දුසිම් ගණන් ගම්මාන වල ග්‍රාම ආරක්‍ෂක ස්ක්වේඩ පිහිටවූහ. ගාඩි පාලුවට ගිය අතර ඉඩම් හිමියන්ගේ අධිකාරිය වාෂ්පීකරණය විය. ගම්මාන විප්ලවීය ගීතවලින් සහ රතු ධජවල රක්ත වර්ණයෙන් බැබැළෙන්නට වූහ.

## සහෝදර කොටෙස්වාර්ලු ආන්ද්‍රා ප්‍රදේශ් ව්‍යාපාරයේ නායකත්වය හොබවයි

කරිම්නගර් දිස්ත්‍රික්කයේ ගොවිජන ව්‍යාපාර බලවත් වූහ. ගොවීහු අනුක්‍රමයෙන් කාකි බලඇණි වල හිංසනය සහ ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට හුරු වෙමින් ඒවාට ප්‍රතිරෝධය දක්වන්නට පුරුදු වූහ. දිස්ත්‍රික් සිරගෙදර හැම විටම පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලද විප්ලවීය ගොවීන්ගෙන් පිරී ගියහ. ප්‍රාදේශීය උසාවි සහ මුන්සිෆ් උසාවි හැමවිටම පොලීසිය විසින් ව්‍යාජ නඩු පවරනු ලැබූ ගොවියන්ගෙන් පිරී පැවතිණි. 1977 න් පසුව පක්‍ෂය නව උපායමාර්ග සමග ජනතාව අතර වැඩ ඇරඹූහ, සහෝදර කොටන්නා කරිම්නගර් සහ අදිලබාද් යන දිස්ත්‍රික්ක දෙකෙන් පිහිටවනු ලැබූ ඒකාබද්ධ දිස්ත්‍රික් කමිටුවේ ලේකම් ධූරයට තේරී පත්විය. 1979 වන විට ව්‍යාපාරය විෂය ක්ෂේත්‍රයන් තුළ වඩාත් ශක්තිමත්ව තීව්‍ර වූ බැවින් මේවාට නායකත්වය දීමට පක්‍ෂ දිස්ත්‍රික් කමිටු දෙකක් පිහිටවූහ. සහෝදර කොටන්නා කරිම්නගර් දිස්ත්‍රික් කමිටුවට තේරී පත්වූ අතර සහෝදර ශ්‍යාම් (දිවි පිදූ නල්ල අඩි රෙඩ්ඩි) අදිලබාද් දිස්ත්‍රික් කමිටුවට තේරී පත්වූහ. 1980 සැප්තැම්බර් කලින් මහජන යුද්ධයේ (PW) හි 12 වෙනි අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයේ පක්‍ෂ සම්මේලනයට නියෝජිතයෙකු ලෙස පැමිණි සහෝදර කොටෙස්වාර්ලු ප්‍රාන්ත කමිටුවට තේරී පත්වූහ. මාස දෙක තුනක කාලයක් තුළදී ප්‍රාන්ත කමිටුව විසින් එහි ලේකම් ලෙස ඔහුව තෝරා පත් කර ගත්හ. ඒ වන විට ඔහුට වයස අවුරුදු 26 ක් විය. එතැන් පටන් ප්‍රහ්ලාද් යන නමින් ඔහු අන්ද්‍රා ප්‍රදේශ් විප්ලවීය ව්‍යාපාරයට නායකත්වය ලබා දුන්හ.
12 වෙනි පක්‍ෂ ප්‍රාන්ත සම්මේලනය ගත් අතිශය වැදගත් තීරණ අතර - කරිම්නගර් සහ අදිලබාද් දිස්ත්‍රික්කවල ගොවි අරගල ගරිල්ලා කලාප දක්වා දියුණු කරමින්, උතුරු තෙලංගානාහි බාම්මාන් සහ නිෂාමාබාද් යන අනෙකුත් දිස්ත්‍රික්ක ඇතුළුව තවත් ප්‍රදේශ කිහිපයක් දක්වා පළල් කරමින් විමුක්ති ප්‍රදේශ පිහිටුවීමේ අරමුණ ඇතිව මහජන විමුක්ති හමුදව පිහිටුවීමට මුල පිරීමට පක්‍ෂ සාමාජිකයින්ගෙන් තුනෙන් එකක් ස්ක්වේඩ් පිහිටුවීමට යවන ලදි. සමස්ත පක්‍ෂයම යුධමය පදනමක සිට ඒවා ක්‍රියාත්මක කිරීමට සූදානම් වූහ. 1980 ජුනි-ජුලි වන විට අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුව තරුණ විප්ලවවාදීන් 35 දෙනෙකු තෝරාගෙන දන්දකර්ණයා වෙත යැවූහ. විප්ලවීය ගොවි ස්ක්වේඩ පිහිටුවීමත් සමග පක්‍ෂය මහජන හමුදව පිහිටුවීමේ පළමු පියවර ගත්හ. කරිම්නගර් සහ අදිලබාද් දිස්ත්‍රික්කවල සන්නද්ධ ගොවි ව්‍යාපාරය මේ සහයෝගය සමග නැගී සිටි අතර සහෝදර ප්‍රහ්ලාද් මෙහිදී ප්‍රාන්ත ලෙකම් වශයෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කළහ.

## ෆැසිස්ට්වාදී රාජ්‍ය හිංසන පසුබිමක් අතරතුරදී කොටන්නාගේ විප්ලවීය ව්‍යාපාරය දියුණු කිරීමේ ක්‍රියාවලිය

සන්නද්ධ ගොවි ව්‍යාපාරය, ශිෂ්‍ය ව්‍යාපාරය මහා පරිමාණයෙන් වර්ධනය වෙමින්, නිර්ධන පංතික අරගල බිහිකරමින්, ප්‍රජාතාන්ත්‍රික අයිතීන්ගේ ව්‍යාපාර දියුණු කරමින් සහ අභිනවයෙන් විහිදී යන වන ව්‍යාපාර යන මේ සියල්ල පාලක පංතිය විසින් ලිහා දමනු ලැබූ රාජ්‍ය ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ සටන් කරමින් වර්ධනය විය. ස්ක්වේඩ් පැතිරී තිබුණු ප්‍රදේශ වලට අසල්වැසි ප්‍රාන්ත පොලීසි මගින් එල්ල කෙරුණු ආක්‍රමණ තීව්‍ර විය, 1980 නොවැම්බර් 2 වන ද දිවි පිදූ සහෝදර පෙඩ්ඩි ශන්කර් දන්දකර්ණයාහිදී දිවි පිදූ පළමුවැන්නා බවට පත්විය.

විප්ලවීය ව්‍යාපාරය නවතා දැමීමට රජය නින්ද සහගතව සංහාරයන්හි නියැලුණහ. ඉන්ද්‍රාවෙල්ලි සංහාරය සිදුවූයේ මෙහි අංගයක් ලෙසයි. අදිලබාද් දිස්ත්‍රික්කයේ RCS සම්මේලන අවස්ථාවේදී 'කොමුරාම් බීම්' අරගලයේ පුරාවෘත්තය රැගෙන ගිය ආදිවාසීහු 1980 අප්‍රේල් 20 ඉන්ද්‍රාවෙලිහි ඒකරාශී වූයේ මහජන රැස්වීමක් පැවැත්වීමටයි. දහස් ගණන් ජනතාව තුදුම් *(Tudum)* වැනි සාම්ප්‍රදයික උපකරණ රැගෙන සහ පිහියා, දුනු, හී වැනි ආයුධ රැගෙන රැස්වීම පවත්වන ස්ථානයට රැස්වූහ. මින් භීතියට පත් වූ කාකි පොලීසිය විශාල ජන සමූහයට වග විභාගයක් නැතිව වෙඩි තැබූහ. මේ සංහාරයෙන් ආදිවාසීන් 13 දෙනෙක් මරුමුවට පත්වී තවත් 60 දෙනෙකු තුවාල ලැබූහ. මේ සිදුවීම අදිලබාද්හි තවත් ජල්ලියන්වලා බාග් ලෙස අපකීර්තියක් අත් කර ගත්හ. ඒ වෙඩි තැබීමෙන් තුවාල වූ අයට වෛද්‍යාධාර සඳහා ප්‍රජාතන්ත්‍රවාදීන් සහ වෛද්‍යවරුන් එක්රැස් කරමින් සහෝදර කොටෙස්වාර්ලු පෙන්වූ සැලකිල්ල සහ කැපවීම හැම විටම විප්ලවවාදීන්ට අනුගමනය කළ යුතු නිදර්ශනයක් ලෙස පවතිනු ඇත.

ඉන්ද්‍රාවෙලී වෙත වූ සියළු මාර්ග වසා දමන්න රජයට අවශ්‍ය විය. නමුත් ඇති කළ තත්ත්වය මේ සමගම වනාන්තරය වෙත බොහෝ මාර්ග විවර කර තිබුණි. හරිත වනයෙන් වටවී තිබූ තැනිබිම් ඇවිලෙන්නට විය. කම්කරුවන්ගේ බාස්ටීස් එකතු විය. ඉන්ද්‍රාවේලි සංහාරය ගල් අඟුරු පතල්වල ගිණි පුපුරු ඇවිලූහ.

## සිංගරේනි කම්කරු ව්‍යාපාරය වර්ධනය කිරීම තුළ ක්‍රියාකාරී භූමිකාව

1981 දී සිංගරේනි කම්කරුවන්ගේ ඓතිහාසික වැඩ වර්ජනය මාස දෙකක් පමණ කාලයක් තිස්සේ පවත්වා ගෙන ගියහ. නියමයක් නොවූ වැඩ වර්ජනය 5 වන වැටුප් මණ්ඩලය ක්‍රියාවට නැංවීමට සහ තවත් යුක්ති සහගත ඉල්ලීම් කීපයක් දක්වා මෙහෙයවීය. වැඩ වර්ජනයෙහි ප්‍රතිඵලයක් ලෙස අඟුරු හිඟවීම නිසා විදුලි බලය උත්පාදනය සීඝ්‍ර ලෙස පහල වැටුණහ. විවිධ කර්මාන්ත වල කාර්මික නිෂ්පාදනය නැවතිණි. දුම්රිය යන්ත්‍ර නිසල විය. එවිට ප්‍රධාන ඇමති අන්ජයියාට කම්කරුවන්ගේ ඉල්ලීම්වලට එකඟ වෙනවා හැර වෙන විකල්පයක් නොවීය. නමුත් ඔහු මුරණ්ඩු මිනිසෙක් ලෙස සාකච්ඡා පැවැත්වීමට එකඟ වූයේ පිළිගත් වෙළඳ සංගම් සමග පමණිණී නව තීරණයක් ගත් පක්ෂයේ මුල පිරීමෙන් නව වෙළඳ සංගමයක් පිහිටවිය. ඒ වන තෙක් පක්ෂයේ සම්මතය වූයේ ප්‍රධාන වශයෙන්ම පැරණි වෙළඳ සම්ගම්හි (ප්‍රධාන වශයෙන්ම ඒ කාලයේ වූ සංශෝධනවාදී වෙළඳ සංගම්) වැඩ කොට ඒවායේ ශක්තිය තහවුරු කිරීමයි. නමුත් ගල් අඟුරු පතල් කම්කරුවන්ගේ දිග්ගැස්සී ගිය වැඩ වර්ජනය 'සිංගරේනි කාර්මික සාමක්යා' (සිකාසා) ලෙස නව වෙළඳ සංගමයක් පිහිටුවීමට මං සැලසුහ. මේ ඓතිහාසික තීරණය පිටුපස සිට ආරම්භයේ සිටම සිංගරේනි කම්කරු ව්‍යාපාරයට නායකත්වය දුන් සහෝදර ශ්‍යාම්ගේ බුද්ධිමත් දැකීම, නිර්මාණශීලීත්වය සහ දක්ෂතාවය සහෝදර ප්‍රහ්ලාද් ඇතුළු අනෙක් සහෝදරවරුන්ගේ ප්‍රශංසාවට ලක් විය. දශක ගණනාවක් තිස්සේ සිකාසා යන්න ගල් අඟුරු කම්කරුවන්ගේ සැබෑ අරමුණු දිනා ගැනීමේ සියළු වැඩවර්ජන සහ අරගලයන්හි පෙරමුණේ සිටි කම්කරුවන්ගේ සංවිධාන ශක්තියේ පොදු වචනය විය. සිකාසා පසුව අන්ද්‍රා ප්‍රදේශ්හි බොහෝ වෙළඳ සංගම් පිහිටුවීමට මූලිකත්වය ගත්හ. සහෝදර කොටන්නාගේ අවමංගුලට සහභාගි වූ සිංගරේනි කම්කරුවෝ අත් මිට මොළවා සිය ආදරණීය නිර්ධන පංතික නායකයාට රතු උත්තමාචාරය පුද කොට ඔහුගේ අරමුණු ඉෂ්ට සිද්ධ කිරීමට නැවත නැවත කැප වන බවට ඔවුන් විසින්ම දිවුරා පොරොන්දු විය. මෙය කොටන්නා සහ කම්කරුවන් අතර වූ විප්ලවීය බැඳීම ප්‍රදර්ශනය කළහ.

1970 දී පක්ෂය නැවත ශක්තිමත් කිරීමේදී බලවත් පරිශ්‍රමයක් දැරූ වැදගත් නායකයෙක් වූ කොන්දපාලි සීතාරාමයියා (KS) 1982 දී අත්අඩංගුවට පත් වූහ. ඔහුව සිරගෙදරින් එළියට ගැනීමට අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුව ක්‍රියාමාර්ගයක් සැලසුම් කළහ. සැලසුමට අනුව අපේ සහෝදරවරු ඔහුව වට කොට තිබූ පොලිස් වළල්ල පාසාරුකරගෙන ගොස් කොස්තාපල්වරයෙකු මරා රෝහලෙන් ඉවතට KS ව ගෙන ගොස් ආරක්ෂිතව විප්ලවීය නායකයන් වෙතට රැගෙන ගියහ. මේ වීර වික්‍රමය 'මහා ගැළවීම' ලෙසින් ප්‍රසිද්ධ වූ අතර විප්ලවීය කඳවුරු ඉමහත් වූ උද්‍යෝගයෙන් පිරී ඉතිරී ගියහ. සහෝදර ප්‍රහ්ලාද් මේ නිර්භීත ගරිල්ලා ක්‍රියාමාර්ගය සැලසුම් කළ සහෝදරවරුන් අතර ප්‍රමුඛයෙකු විය. පක්ෂ නායකත්වය යටතේ වර්ධනය වන විප්ලවීය ව්‍යාපාරය සතුරාට ගතවන සෑම දිනයක්ම නින්දක් නැති දින බවට පත් කළහ. 1981 අවසානය වන විට කරීම්නගර් දිස්ත්‍රික්කයේ ජගිත්යාල් ප්‍රදේශයේ ප්‍රබල ලෙස ගොතන ලද ව්‍යාජ සටන් ඇරඹී අතර අනෙක් ප්‍රදේශවලත් එය පැතිරී ගියේය. කැපී පෙනෙන පක්ෂ කාඩර්වරු වූ බායියප්පු දේවේන්දර් රෙඩ්ඩි, හරිභූෂාන්, පල්ලෙ කනකන්නා, බයිරි ගංගාරාම්, රාමක්‍රිෂ්ණා, නාගේෂ්වරා රාඕ සහ සායිනි ප්‍රභාකාර් සතුරු හස්තයේදී මිය ගියහ. සහෝදර ප්‍රහ්ලාද් ආගිය තැන්හි සුළඟ ගැන පවා ඉව ඇල්ලූ, ව්‍යාජ සටන්වලට තෑගි හා ගතමනා ලැබූ කෲර කාකි නිළධාරීහු හයිද්‍රාබාද්හි (ප්‍රාන්තයේ අගනුවර) දී ඔහුව අල්ලා ගැනීමට උත්සාහ කළහ. ඔහු ඔවුන්ට සිය පිස්තෝලයෙන් පිළිතුරු දී පහසුවෙන්ම ගැලවී නගරයේ ජන ගංගාව තුළට වැදුණි. විශේෂයෙන්ම විප්ලවීය ව්‍යාපාරය ඉලක්ක කර ගනිමින් ව්‍යාජ සටන් වැඩි කරමින් සිටින ප්‍රබල පෙළේ පොලිස් නිළධාරීන්ට දැඩි ලෙස දඬුවම් කිරීමට පක්ෂය තීරණය කළහ. පංති අරගලය තීව්‍රවන ගම-නේදී ගොවි සහ ශිෂ්‍ය ගරිල්ලා භටයෝ කෲර පොලිස් නිළධාරීන්වූ යාදගිරි රෙඩ්ඩි (බෂිපටි SI), බුචි රෙඩ්ඩි (පෙද්දපාලි DSP), කොමාල් රෙඩ්ඩි (ප්‍රධාන කොස්තාපල්) සහ ලක්ෂ්මන් රාඕ (කගාෂ් නගර් SI) වැනි අය ඔවුන්ගේ ප්‍රදේශයේම සාදන ලද ගිනි අවි වලින් මරා දමන ලදි. භීතියට පත් වූ සතුරා උපායක් ලෙස බියගුළු ක්‍රමයකට සිවිල් අයිතිවාසිකම් සංවිධානවල නායකයින් ඝාතනය කළහ. වරන්ගාල් හි දෙස්තර රාමනාධම් සහ කරීම්නගර් හි ජාපා ලක්ෂ්මා රෙඩ්ඩි මරා දැමූහ. ජගිත්යාල්හි ජාතිභේදවාදීන් විසින් නීතිඥ ගෝපි රාජන්නා මරා දැමූහ. මේ ඝාතනයන් සමග රජය සිය නිරුවත් ෆැසිස්ට්වාදී ස්වභාවය හෙළි කළහ. එය නැවත වතාවක් ලෝකයා වෙත ප්‍රජාතන්ත්‍රවාදය, ව්‍යවස්ථාව යනු රැවටිල්ලක් මිස වෙන කිසිවක් නොවන බව ඔප්පු කරන ලදි.

රජයේ සංහාරයන්ට ප්‍රසාරණය වන සහ ශක්තිමත් වන විප්ලවීය ව්‍යාපාරය නැවැත්විය නොහැකි විය. 1985 දී 'සමස්ත ඉන්දීය විප්ලවීය ශිෂ්‍ය සංගමය' පිහිටවනු ලැබූහ. ප්‍රාන්ත කිහිපයකම පිහිටුවා තිබූ විප්ලවීය ශිෂ්‍ය සංවිධාන සමස්ත සංගමය පිහිටුවීමට එක්ව ශක්තිමත් ශිෂ්‍ය ව්‍යාපාරයක් ඉදිකිරීමට උර දුන්හ. සහෝදර ප්‍රහ්ලාද් මේ සංගමය ඉදි කිරීමට වෑයම් කොට තිබුණා පමණක් නොව එහි පළමු සම්මේලනය සාර්ථකව පැවැත්වීමට සමීප මගපෙන්වීමද ලබා දුන්හ.

අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුව විසින් නිකුත් කළ ''ආත්මාරක්ෂක යුද්ධය සමග සතුරා විසින් අප්‍රකාශිත කළ යුද්ධය පරාජය කරමු'' ශීර්ෂයෙන් යුත් පොදු ප්‍රකාශනයේ ආලෝකයෙන් පක්ෂය වැදගත් තීරණ කිහිපයක් ගත්හ. සතුරා විසින් මුදා හරින ලද මර්ධනයේ තත්ත්වයන් යටතේ විෂයමූලික බලවේග ආරක්ෂා කිරීමේ අංගයන් ලෙස ප්‍රාන්ත කමිටුවේ සාමාජිකයින් ගණන 5 දක්වා අඩු කොට සැලකිය යුතු කාඩර්වරු සංඛ්‍යාවක් දන්දකර්ණායා (DK) වෙත

යවමින්, විශේෂයෙන්ම කාර්මික නගර තුළත්, රටේ අනෙක් ප්‍රාන්ත තුළත් විප්ලවීය බලවේග අළුතින් ව්‍යාප්ත කිරීමෙන් පක්ෂය විශේෂ උපායමාර්ගයන් දියත් කළහ. පක්ෂයේ තීරණායට අනුව මේ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස සහෝදර කොටන්නා වනයට ගොස් දන්දකර්ණායා ව්‍යාපාරයට මගපෙන්වීමේ වගකීම භාරගත්හ. මෙලෙස ඔහු සන්නද්ධ ගරිල්ලා ස්ක්වේඩයන් වෙතට සහ මහජන යුද්ධයේ සටන් බිමට සේන්දු විය. ඔහු, 'කොමුරාම් බිම්' හි සහෝදරත්වයෙන් ප්‍රති 'නිෂාම්' අරගලයේ කොටසක් ලෙස රෂාකාෂ් සමග සටන් වදිමින් සිටියදී දිවි පිදූ නිර්භීත ආදිවාසී රණශූරයෙකු වූ 'රම්පි ගොන්ද්' ගේ නම ගත්හ. එතැන් පටන් ජනතාව සහ කාඩර්වරු අතර 'රම්පි ඩාඩා' ලෙස ප්‍රසිද්ධියට පත් වූ ඔහු ඔවුන්ගේ ආදරය දිනාගෙන ඔවුන්ගේ හදවත් තුළ සදකාලික ඉඩක් කැටයම් කළහ.

## මහජන යුද්ධයේ සෙන්පති ලෙස ආශ්වාදජනක ගරිල්ලා ජීවිතය

මහජන යුද්ධ දේශපාලනයට සහෝදර රම්පි එක්වූ පසු, ඔහු බලවත් සැලකිල්ලෙන් යුතුව මහජන යුද්ධයේ මූලධර්මයන්, ගරිල්ලා යුද කටයුතු, මහජන හමුදවක් ගොඩනැගීමේ අවශ්‍යතාව, චීනයේ අත්දැකීම්, රුසියානු සහ වියට්නාම් විප්ලව, රතු හමුදවේ අත්දැකීම්, ලෝක යුද්ධවල අත්දැකීම්, සුන් ත්ෂු සහ ක්ලෝස්විට්ෂ් වැනි යුධ විශේෂඥයින්ගේ ලිපි සහ විවිධ රටවල යුධ අත්පොත් ගැඹුරින් කියවීමට පුරුදුව සිටියහ. ඒවා අධ්‍යයනය කරන අතරෙදිම පක්ෂ කාඩර්වරුන්ටත් ඒවා කියවීමට සැලැස්වීම කෙරේ ඔහු මහත් අවධානයක් යොමු කිරීමට පුරුදුව සිටියහ. මෙය ඔහු තුළ වූ සාමූහික ජීවය පෙන්වා දෙයි. යුධ පුහුණාව සඳහා විශේෂ සැලකිල්ලක් දැක්වීමටද ඔහු පුරුදුව සිටියහ. ඔහු මහත් අභිරුචියෙකින් සහ සැලකිල්ලෙන් යුතුව දෙමළ කොටින්ගේ සටන් අත්දැකීම්, සික් යුද්ධයේ අත්දැකීම් සහ ඉන්දියානු ඉතිහාසයේ වූ බොහෝ සටන් අධ්‍යයනය කළහ. ඔහු මාඕවාදී යුධ න්‍යායන්ගේ දෘෂ්ටියෙන් මේවා සමාලෝචනය කරමින් මේ අත්දැකීම් කාඩර්වරුන්ට බෙදා දීමට බොහෝ සේ වෙහෙස විය. ඔහුගේ යුධ කෞශල්‍ය සහ ශක්තිය දියුණු කර ගැනීමට ඔහු නිරන්තරයෙන්ම පුහුණුවීම් කළහ.

1981 වැසි සමයේදී පවත්වාගෙන ගිය පළමු යුධ පුහුණු කඳවුරට සහෝදර රම්පි පැමිණියහ. වරංගාල් සහ කරිම්නගර් දිස්ත්‍රික්ක සීමාවේ වූ වනාන්තරවල පැවැත්වූ මේ කඳවුරේදී, උපදේශකවරුන් විසින් උගන්වනු ලැබූ සියළු ශිල්පීය ක්‍රමවේදයන් ඔහු මහත් උනන්දුවෙන් උගත්හ. පුහුණුව අතරතුරේදී, කලාප ඉංජිනේරු විද්‍යාලයේ ශිෂ්‍යයෙකු වූ ද, බෙල්ලම්පාලි නිර්ධනීන්ගේ ආදරණීය පුතෙකු වූ සහෝදර ගජ්ජේලා ගංගාරාම් අත්වැරදීමකින් ග්‍රෙනේඩයක් පිපිරීම නිසා ජීවිතක්ෂයට පත් වූහ. සහෝදර රම්පි, වනයවෙතට වූ පළමු විදරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස සිය ලෙයින් දිවි පිදූ සහෝදර පෙඩ්ඩි ශන්කර් ව සහ යුධ පුහුණුවේ අංගයකදී දිවි පිදූ සහෝදර ගංගාරාම් ව කිසිදා අමතක නොකළහ. ඔහු ඔවුන්ගෙන් ආදර්ශයන් ලබාගෙන ඒවා පක්ෂ නිළයන් හා බෙදා ගැනීමට විශේෂ අවධානයක් යොමු කළහ. 1981 දී කඳවුර ඇරඹීමත් සමග සහෝදර රම්පි 1989 වන තෙක් දන්දකර්ණායාහි පැවැත් වූ සියළු ප්‍රධාන යුධ පහුණු කඳවුරුවලට සහභාගි වූහ. 1982 දී කොට්ඨාශ තුළ යුධ පුහුණු කඳවුරු පැවැත්විමේදී, දේශපාලන ගුරුවරයෙකු ලෙස ඔහු ගරිල්ලා භටයින්ට මහජන යුද්ධයේ පාඩම් සහ විශේෂයෙන්ම ගරිල්ලා යුද ක්‍රමයේ යුද්ධෝපායයන් ඉගැන්වීය. ඒ දවස්වල ඔහු ගරිල්ලා භටයින්ට ඉගැන්වූ අනතුරු හැඟවීමක් වූ 'ආලෝකය රාත්‍රී සතුරාය' යන පාඩම් අද දක්වාත් කාඩර්වරුන්ට මතකයේ තිබේ. 1983 දී පැවැත් වූ මධ්‍යම යුධ පුහුණු කඳවුරට ශිෂ්‍යයෙකු සහ දේශපාලන ගුරුවරයෙකු ලෙස සහභාගි වූ ඔහු ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටු ලේකම් වශයෙන් බල ඇණිවලට හොඳ පුහුණුවක් ලබා දීමට කළ හැකි හැම දෙයක්ම කළහ. ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුවේ සහ දන්දකර්ණායා වන කමිටුවේ මුල පිරීමෙන් 1987 දී සහ 1989 දී පැවැත්වූ යුධ පුහුණු කඳවුරුවල වැදගත් සිදුවීම් විය. නිර්ධන පංති ජාත්‍යන්තරවාදය සහිත වූ, මාඕවාදීන් බවට පත්වූ ශ්‍රී ලංකාවේ සමහර දෙමළ ජාතික සටන්කරුවෝ උසස් යුධ දැනුම බෙදා දීමට මේ කඳවුරුවලට උපදේශකවරු විදියට





**මාඕවාදී මහජන විමුක්ති ගරිල්ලා හමුදාව වනය තුළ පුහුණුවීම් වළ නිරත වෙමින්...**

සහභාගි වූහ. ඔවුහු ගරිල්ලාවන්ට අවශ්‍ය වන යුධ ක්‍රම ඉගැන්වූහ. සහෝදර රම්පී මහත් උද්‍යෝගයෙන් යුතුව මේ සියල්ල උගත්හ. සතුරාට එල්ල කරන නිර්භීත ප්‍රහාර සාර්ථක කර ගනු වස් ජංගල් මහල්හි ගරිල්ලා භටයින්ට සිය අත්දැකීම් බෙද දුන්හ. 2010 පෙබරවාරි 15 නැගෙනහිර පෙරමුණේ ජවානාස් රයිෆල් භටයින්ගේ සිල්ඩා කඳවුරක් වට කොට ඔවුන්ව සමූලඝාතනය කිරීම ඔහුගේ යුධමය ශූරත්වය විදහා දැක්වීමේ නිදර්ශනයක් ලෙස දැක්විය හැකිය. එම පරපුරේ ගරිල්ලා අණදෙන්නන්ට සහෝදර රම්පීගේ සටන් පාඨයක් වූ 'හොඳින් කන්න, හොඳින් වැඩ කරන්න' තවමත් මතකයේ පවතී.

සහෝදර රම්පී ඔහුගේ යුධ විනය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් ඉසිලූහ. ශාරීරික යෝග්‍යතාවයට ඉමහත් වටිනාකමක් දුන් ඔහු ගරිල්ලා විනය පවත්වා ගැනීමේ අංගයක් ලෙස අනෙක් හැම අයකුටම එය අනුගමනය කරවීමට සැලකිල්ල යොමු කළහ. නිවැරදිව, ගිනි අවිය රැගෙන පුහුණු භූමිය තුළ වූ සෑම අංගයක්ම පුහුණු වීමේ සිට හොඳින් පුහුණු වූ මාඕවාදී යුධ අණදෙන්නන් වශයෙන් ඔවුන්ව සෑම දෙයකින්ම සම්පූර්ණ කරන්නට ඔහු පුරුදුව සිටියහ. අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුවේ (APSC) නායකත්වය යටතේ දන්ඩකර්ණයා වන කමිටුවේ (DKFC) ගරිල්ලා ස්ක්වේඩයන්හි අත්දැකීම් සමස්තයකට ගළපමින් ස්ථාවර නියෝග සඳහා ගරිල්ලා ස්ක්වේඩයන් ක්‍රමවත් කළහ. ඔවුන් සමග ගරිල්ලා විනය ක්‍රියාවට නංවමින් පරමාදර්ශී වීමට සහෝදර රම්පී පුරුදුව සිටියහ. නැගෙනහිර ඝාට් හෝ මාඩ් කඳු යන මේ කොයිකෙදිත් සැහැල්ලුවෙන් ඔවුන් සමග කඳු නැගීමට ඔහු පුරුදුව සිටියහ. ඔහු තරුණ ජවයෙන් යුතුව ගමන් බඩු බෑගය (luggage) (ලගේජ්) රැගෙන ඇවිදිමේදී සහ දිවීමේදී අනෙක් සහෝදරවරුන් සමග තරඟ කරමින් ඔවුන්ව දිරිමත් කළහ. ගරිල්ලා භටයෙකුට අවම වශයෙන් තමන්ගේ ඇඳුම සහ ආයුධ වලට අමතරව කිලෝ 20-25 තරම් ලගේජ් එකක් රැගෙන ඕනෑම විධියේ භූමියක, ඕනෑම දුරක් ඇවිදීමට හැකි විය යුතුයැයි ඔහු නිතර ප්‍රකාශ කළ දෙයක් විය. ඔහු එය ක්‍රියාවට නංවා පෙන්වමින් එය අනුගමනය කිරීමට අනෙක් අයව දිරිමත් කළහ.

1999 දී මධ්‍යම කාරක සභාව ගරිල්ලා හමුදාව පිහිටුවීම ගැන ගැඹුරු සහ පුළුල් වූත් සාකච්ඡා පවත්වන ලදි. එය 1980 සිට 1999 දක්වා වර්ධනය වූ ස්ක්වේඩ සහ කම්පැනි වල අත්දැකීම් සමාලෝචනය කළහ. මුදාගත් ප්‍රදේශ ඉදි කිරීමේ අරමුණ ඇතිව මහජන යුද්ධය තුළ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම ගැන මධ්‍යම කාරක සභාව මුළුමනින්ම සාකච්ඡා කළහ. මේ සාකච්ඡාවල ප්‍රතිඵලය වූයේ 2000 දෙසැම්බර් 2 වන දින මහජන විමුක්ති ගරිල්ලා හමුදාව (PLGA) පිහිටුවීමයි. සහෝදර රම්පී මෙහිදී ක්‍රියාකාරී භූමිකාවක් රඟ දැක්වූහ. මහත් වූ විප්ලවීය උද්‍යෝගයෙන් පිරුණු වාතාවරණය යටතේ PLGA පිහිටුවීමට මග පෙන්වීමට ඔහු එම දිනයේදී දන්ඩකර්ණයාහි විය. මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස ගරිල්ලා භටයින්ට මධ්‍යම කාරක සභාවේ පණිවුඩය නිර්මාණශීලීව පැහැදිලි කොට මහජන හමුදාව ගැන ඔවුන් තුළ ගැඹුරු අවබෝධයක් ඇති කළහ. 2010 දෙසැම්බර් PLGA පිහිටුවා 10 වසරක් ගතවීම අනුස්මරණය කිරීම නිමිත්තෙන් වූ රැස්වීමේදී ඔහු සම්මේලනයේ ප්‍රධාන අරමුණු වලට අනුව සෑම අවස්ථාවකදීම PLGA හි ශක්තිය සහ දක්ෂතාවය වර්ධනය කිරීමට අවශ්‍ය දෑ මතක් කර සවිළදයි ලෙස කථා කළහ. ඔහුගේම වචන වලින්...

''ශක්තිමත් මහජන අරගල ඉදිකිරීමෙන් තොරව සහ දේශපාලනිකව පොළඹවමින් මහා පරිමාණයෙන් ජනතාව බඳවා ගන්නේ නැතිව අපිට ශක්තිමත් මහජන හමුදාවක් ගොඩ නැගිය නොහැකියි. එසේම මහජන හමුදාවේ සහය නැතිව අපිට දිගු කල් ගතවන ජනතා අරගල පවත්වාගෙන යෑම කළ නොහැකියි...සතුරා එක්

ප්‍රදේශයකදී අපිව වට කරන්නේ නම්, අපි වෙනත් ප්‍රදේශයක සතුරාව වට කළ යුතුයි. අපි අළුත් ප්‍රදේශ කිහිපයකම අරගල නිර්මාණය කළ යුතුයි. රට පුරාම විහිදුණු අරගලයකින් අපි සතුරාව වට කළ යුතුයි...

''...PLGA නැතිව මහජන අරගල පවතින්නේ කොහිද, අපි එතැන PLGA සෑදිය යුතුයි. අරගල නොපවතින්නේ කොහිද, PLGA සහය ඇතිව අපි එම තැන් වල අරගල නිර්මාණය කළ යුතුයි.''

## දන්ඩකර්ණයා ව්‍යාපාරය සංවර්ධනය කිරීම තුළ සහෝදර රම්පීගේ කාර්යභාරය

1986 සිට 1993 දක්වා දන්ඩකර්ණයා ව්‍යාපාරය වර්ධනය කිරීම ගැන සිත යොමු කළ සහෝදර රම්පී මධ්‍යම කාරක සභිකයෙකු වශයෙන් වගකීම් කරට ගත්හ. 1986 සිට අන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්ත කමිටුවේ (APSC) සාමාජිකයෙකු වශයෙන් දන්ඩකර්ණයා ව්‍යාපාරයට මග පෙන්වූ ඔහු 1987 අළුතින් පිහිටුවන ලද වන කමිටුවේ සාමාජිකයෙකු විය. 1987 සිට 1993 අතර කාලය තුළදී වන කමිටුවේ සාමාජිකයෙකු සහ ලේකම් වශයෙන් දන්ඩකර්ණයාහි (DK) හි විප්ලවීය ව්‍යාපාරය දියුණු කිරීමට වෙහෙස නොබලා ක්‍රියා කළහ. කෙසේවුවද ගාද්චිරෝලි කෙරේ වැඩි අවධානයක් යොමු කළ ඔහු, අදිලබාද් සිට මන්යාම් (නැගෙනහිර ඝාට්ස්) දක්වා වූ සෑම කොට්ඨාශයකම ව්‍යාපාරයන් සමග වෙළී ගත්හ. ඔහු මධ්‍යම ඉන්දියාව දක්වා විහිදුණු බලගත් කලාපය (Balaghat division) සංවර්ධනය කරන්නට 1989 දී විශේෂ ප්‍රයත්නයක් දැරූහ. ව්‍යාපාරයේ අවශ්‍යතාවයන්ට අනුව දිගු කාලීන දර්ශනයකින් යුතුව ව්‍යාපාරය පුළුල් කිරීමේ කටයුතු සඳහා ඔහු දිගටම ප්‍රාන්ත කමිටු සහෝදරවරු දිරිමත් කළහ. විශේෂයෙන්ම උතුරු ඉන්දියාවේ අනෙක් ප්‍රාන්ත ඇතුළුව උතුරු බෙංගාලයේ විප්ලවීය ව්‍යාපාරය පළල් කිරීම සඳහා 1993 අගභාගයේදී දන්ඩකර්ණයා වෙතින් බොහෝ ඈතට ගමන් කළත්, දන්ඩකර්ණයා ව්‍යාපාරය සමග සජීවී සම්බන්ධතාවයන් පවත්වා ගනිමින් සෑම යුධමය ක්‍රියාකාරකමක්ම සහ දේශපාලන සහ සංවිධානමය වෙනස්කමක්ම අනුගමනය කොට ඒවා අධ්‍යයනය කළහ.

ඔහු කමිටු සාමාජිකයින් සමග දන්ඩකර්ණයා ව්‍යාපාරයේ තත්ත්වය ගැන සාකච්ඡා කරමින් මනා උපායයන් ක්‍රියාවට නංවමින් සුවිශේෂී ක්‍රියාකලාපයක් ඉටු කළහ. ඔහු දන්ඩකර්ණයා වල නාගරික කටයුතු සංවර්ධනය කිරීමට සංවිධාන පද්ධතියක් හඳුන්වා දෙමින් චන්ද්‍රපූර්, ජග්-දල්පූර්, රයිපූර්, රාජ්නන්ද්ගම්න් සිට සිරොන්චා සහ අලපෙල්ලි දක්වා සංවිධායකයින් යැවීම මගින් ඒවා ක්‍රියාවට නැංවීම කෙරේ විශේෂ අවධානයක් දැක්වූහ. මහජන සංවිධාන ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා වන කමිටුවේ තීරණයකට අනුව ඔහු මහජන සංවිධාන තුළ සංවිධායකයින්ගේ පද්ධතිය ක්‍රියාවට නැංවූහ. ඔහු තැනිතලා/නාගරික ව්‍යාපාර අතර හොඳ සමායෝජනයක් ඇති කිරීමට සුදුසු සංවිධාන ව්‍යූහයක් හඳුන්වා දෙන්න උත්සාහ කළහ. වන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සහ පසුව මධ්‍යම සංවිධාන කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහෝදර රම්පී ප්‍රධාන වශයෙන්ම යුද පෙරමුණ ප්‍රවර්ධනය කිරීමේ කාර්යයක් වශයෙන් දන්ඩකර්ණයාහි දී විශේෂ හමුද ස්ක්වේඩ 1993 දී සහ ප්ලෑටූන 1995 දී පිහිටුවීම හඳුන්වාදෙමින් මහජන විමුක්ති හමුදව සඳහා පදනම අතුරමින් ඔහුගේ ඉමහත් පුරෝගාමීත්වය දැක්වීය. ග්‍රාම් රාජ්‍ය කමිටු (GRC- වර්තමානයේ විප්ලවීය ජනතා සර්කාර්) පිහිටුවීමේ සහ ඒවා දන්ඩකර්ණයා වලදී ක්‍රියාවට නැංවීමේ මධ්‍යම කාරක සභාවේ අභිප්‍රායන් පිටුපස සහෝදර රම්පීගේ මතවාදී සහ දේශපාලන ව්‍යායාමය සුවිශේෂ විය.



**ජනතාව, තමන්ව සූරාකමින්, කෲරකම් සිදු කළ ඊනියා මාක්ස්වාදී (CPM) රජයේ කාර්යාල වනසමින්.**



**මාඕවාදී සහෝදරවරු යුධ පුහුණුව සිදු කරමින්.**

මහා පරිමාණයෙන් සතුරන් සමූලඝාතනය කොට සතුරාට එරෙහිව උපායික ප්‍රතිප්‍රහාර තියුණු කිරීමෙන් ආයුධ අල්ලා ගැනීම ගැන, මහජන විමුක්ති හමුදව සහ මහජන මිලීෂියාව සන්නද්ධ කිරීම ගැන, සෑම ප්‍රදේශයකම මහජන යුද්ධය ප්‍රවර්ධනය කිරීම ගැන සහ විමුක්ති ප්‍රදේශ ඉදි කිරීමේ අරමුණ ඇතිව ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම ගැන මධ්‍යම කාරක සභාව සහ SZC මගින් විශ්ලේෂණය සහ සංශ්ලේෂණය කරන ලද දන්ඩකර්ණයා ව්‍යාපාරයේ අත්දැකීම් මත දන්ඩකර්ණයා නිම්නය තුළ ගරිල්ලා යුද්ධය දියුණු කිරීම ගැන දිගටම සහෝදර රම්පී කල්පනා කළහ. ඔහු කාලානුරූපී තීරණ ගැනීමට පක්ෂ කමිටුවේ සහ නායකත්වයේ සිටින කාඩර්වරුන් දිරිමත්කොට පෙළඹවූහ. ආරම්භයේ සිටම ගරිල්ලා කලාප වල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ආයුධ නිෂ්පාදනය කිරීමට විශේෂ ඒකක පිහිටුවීම ගැන ඔහු විශේෂ අවධානයක් දැක්වූහ.

මධ්‍යම කාරක සභාවේ මග පෙන්වීම යටතේ, සහෝදර රම්පී පසු ගිය 30 වසර පුරා දන්ඩකර්ණයා හි සිදුවූ සෑම නැම්මකම සහ වෙලීමකම ඔහුගේ අනන්‍ය සලකුණක් තැබූහ. දන්ඩකර්ණයා ව්‍යාපාරය වර්ධනය කිරීමෙහි ලා සහෝදර රම්පීගේ කාර්යභාරය අමතක කළ නොහැකිය. විකල්ප මහජන පාලන ව්‍යූහයක් ගොඩ නැගීම සඳහා ප්‍රයත්න දැරීමට ජගිත්යාල් සහ දන්ඩකර්ණයාවලදී වැඩ කිරීමෙන් ඔහු ලබා ගත් අත්දැකීම් භාවිතාවට යෙදූහ. දන්ඩකර්ණයා පක්ෂය විසින් 30 වසරක දන්ඩකර්ණයා විප්ලවීය ව්‍යාපාරය සැමරීම සඳහා 2011 පෙබරවාරි 10 වන දින පැවැත්වූ උත්සවයට ඔහු උද්‍යෝගිමත් ලෙස සහභාගි වූහ. ලෝකය පුරා විප්ලවීය තත්ත්වයන් වර්ධනය වන සහ නායකත්වය අභිමිවීමේ පසුබිමක දන්ඩකර්ණයා ව්‍යාපාරය අභිමුඛව පවතින අභියෝග ඔහු ගැඹුරින් විශ්ලේෂණය කළහ. එය ඔහු දන්ඩකර්ණයාවල විප්ලවීය නිළයන්ට ලබා දුන් අවසාන පණිවුඩය විය.

## රට පුරා විප්ලවීය බලවේග වල සමගිය මුදුන් පමුණුවා ගැනීමට ප්‍රයත්න දැරූ පරමාදර්ශී කොමියුනිස්ට්වාදියෙක්

මධ්‍යම සංවිධාන කමිටුවේ (COC) සාමාජිකයෙකු ලෙස සහෝදර රම්පී 1993 අගභාගයේදී ව්‍යාපාරය උතුරු සහ නැගෙනහිර ඉන්දියාව තුළ ව්‍යාප්ත කිරීමට වගකීම් භාර ගත්හ. ඔහු වැඩ කළ ප්‍රධාන කලාපය බටහිර බෙංගාලය. එහිදී ඔහු තමාව 'කිසෙන්ජී' ලෙස හඳුන්වා ගත්හ. ඔහු එකවිටම එහි බොහෝ වගකීම් දැරූහ.

ශ්‍රේෂ්ඨ නක්සල්බාරි කැරැල්ලෙන් පසු තාවකාලික පසු බැසීමෙන් අනතුරුව පීඩා විඳි කොල්කටා නගරය, නාඩියා, මුර්ෂිදබාද්, පැරගනාස් 24, නැගෙනහිර සහ බටහිර මිඩ්නාපූර් දිස්ත්‍රික්ක වල විප්ලවීය ව්‍යාපාරය නැවත ඉදිකිරීමේ සහ දියුණු කිරීමේ වගකීම පක්ෂය ඔහුට පැවරූහ. අනතුරුව මධ්‍යම කාරක සභාව නක්සල්බාරි පරාජයෙන් පසු විවිධ කණ්ඩායම් වලට බෙදී ගිය පක්ෂය එක්සත් කිරීමේ ප්‍රධාන කාර්යයන් ඉෂ්ට කිරීමට නියෝජිත මණ්ඩලයේ සාමාජිකයින් තෝරා ගත්හ, ඔහුගේ වගකීම ඔහු විශිෂ්ඨ ලෙස ඉටු කළහ. වාම අවදනම්කාරී සහ දක්ෂිණ අවස්ථාවාදී බව නිසා කැඩී ගිය සහ එතෙක් බෙදී ඉතිරි වී තිබෙන පාර්ශ්වයන් සමග දේශපාලන සමගිය මුදුන්පත් කර ගැනීමට ඔහු ගැඹුරු ලෙස සහ පුළුල්ව කුඩා සහ විශාල කණ්ඩායම් වල, පක්ෂවල දේශපාලනික සහ මතවාදී වෙනස්කම් අධ්‍යයනය කළහ. ඔහු පුළුල් දෘෂ්ඨියෙකින් යුතුව ඔවුන්ව තේරුම් ගත්හ.

එකල මාක්ස් ලෙනින්වාදී පක්ෂය විසින් 70 මැද ගණන්වලදී ගනු ලැබූ එක්සත් කිරීමේ ප්‍රයත්නය කිසිදු ශුභවාදී ප්‍රතිඵලයක් ලබා නොදුණිනී පළමුව පක්ෂයේ 'Strategy and Tactics' සහ ‘ස්වයං විවේචන වාර්තාව’ යන ලිපි මත පදනම්ව එය විප්ලවීය මහජන ව්‍යාපාරය ගොඩ නැගීම කෙරේ යොමුවිය යුතු බවට පක්ෂය තීරණයකට පැමිණියහ. අව්‍යාජ විප්ලවවාදීන් අතර ප්‍රතිපත්තිමය සමගියක් ප්‍රතිෂ්ඨාපනය කර ගෙන නැවත එක්සත්වීමේ ප්‍රයත්නය ගෙනයාමට හැකි වන්නේ එම අත්දැකීම් මත පදනම් වීමෙන් පමණක් යයි පක්ෂය දැඩිව තීරණය කළහ. කරිම්නගර් සහ අදිලබාද් දිස්ත්‍රික්කවල මහජන ව්‍යාපාර ගොඩනැගීමෙන් අත් කර ගත් සාර්ථකත්වය ඉතිහාසයේ ගමන වෙනස් කළහ. එය ඒවා ඉහළ මට්ටමේ ව්‍යාපාර දක්වා වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගයක කොටසක් වූ අතර දන්දකර්ණයා ව්‍යාපාරය ඉදිරියට පැමිණියේය. 1980 අග වන විට උතුරු තෙලංගානා සහ දන්දකර්නයා ගරිල්ලා කලාප ලෙස දියුණු වූහ. මේ අනර්ඝ අත්දැකීම් මත පදනම්ව, ඔවුන්ගේ නියෝජිතයා සහ නායකයා ලෙස සහෝදර කොටෙස්වාර්ලු සමස්ත රට පුරාම පක්ෂය සමගි කිරීමේ කාර්යභාරය ගෙන ගියහ.

AICCCR (කොමියුනිස්ට් විප්ලවවාදීන්ගේ සමස්ත ඉන්දියානු සමායෝජන කමිටුව) පිහිටුවීමේ කාලය වන විට කලින් මාඕවාදී කොමියුනිස්ට් මධ්‍යස්ථානය (MCC) සහ කලින් මහජන යුද්ධ පක්ෂය ස්වාධීනව පැවති අතර අති විශාල ප්‍රදේශයක විප්ලවීය ව්‍යාපාරය ගොඩ නගමින් සිටියහ. එම පක්ෂ දෙකම, 1980 ආරම්භයේ සිට වෙනස් ධාරාවන් දෙකක් වඩා බලසම්පන්න එකක් ලෙස එක්සත් වීමට ගෙන යනු ලබමින් තිබුණු සමගි සාකච්ඡා සඳහා බොහෝ වැදගත්කමක් ලබා දුන්හ. කලින් මහජන යුද්ධ පක්ෂය පවා කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්-ලෙනින්වාදී) හි කොටසක් වූ පක්ෂ එකමුතුව (Party Unity) සමග එක්සත්කම සාක්ෂාත් කර ගැනීමට ප්‍රයත්නයන් දරමින් තිබුණි.

එම කාලයේදීම සහෝදර කොටෙස්වාර්ලු බටහිර බෙංගාලයේ ව්‍යාපාරය හානි වලින් පීඩාවට පත්වූ තැන් වල ධෛර්ය සම්පන්නව සිය අතිමහත් සංවිධාන ධාරිතාව යොදවමින් ඔහුගේ වැඩ ඇරඹූහ. ඔහු තමා වැඩ ඇරඹූ ඕනෑම තැනක යහපත් ප්‍රතිඵල ලබා දෙන විශ්වාසය දිනූ නායකයෙකු විය. ඉක්මනින්ම කොල්කටා නගරය තුළ, ජනාධිපති පාසල තුළ සහ ජදව්පූර් විශ්ව විද්‍යාලය තුළ විප්ලවීය ක්‍රියාකාරකම් ඇරඹුණි. පක්ෂය පැවරූ කාර්යභාරය ඉටු කිරීමේ අංගයක් ලෙස සහෝදර කොටෙස්වාර්ලු, නක්සල්බාරි අවධියේ සිටම ක්‍රමයෙන් නව සංශෝධනවාදී මාක්ස්වාදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (CPM) බලයේ මූලස්ථානය බවට පත්ව තිබූ බටහිර බෙංගාලය තුළ නැවත වරක් විප්ලවීය ව්‍යාපාරය වඩාත් ශක්තිමත් කිරීමට වෑයම් කරන්නට වූහ. ‘මාක්ස්වාදීන්’ (වෙන කිසිදු ප්‍රාන්තයකම කවදාවත්ම සිදු නොවූ) විසින් බටහිර බෙංගාලය තුළ ක්‍රියාවට නංවන ඉඩම් ප්‍රතිසංස්කරණ පිළිබඳ සහ ඔවුන් ජනතාවට පොරොන්දු ලබාදෙමින් තිබුණු ව්‍යාජ පාරාදීසය පිළිබඳව වූ ව්‍යාජ ප්‍රචාරය සමස්ත ලෝකයම දැනගන්නට පටන් ගත්හ. නක්සල්බාරි නැවත ස්ථානගත වී ඔවුන්ගේ බලයෙහි අසුන හෙල්ලුම් කන්නට වූ අතර මෙය ඔවුන්ගේ විනාශයේ ඇරඹුම වූ හෙයින් ඔවුහු භීතියට පත්වූහ. දශක තුනකට වඩා කාලයක් බටහිර බෙංගාලය තුළ ජනතා-නාශක පාලනයක් ගෙන ගිය ‘මාක්ස්වාදීන්ගේ’ ‘රතු වර්ණය’ ජනතා ව්‍යාපාර වල මහා ප්‍රවාහයෙන් සේදී යන්නට විය. මේ ව්‍යායාමය තුළ සහෝදර කොටෙස්වාර්ලු මහත් ප්‍රසිද්ධියට පත්වූහ. එහි සමාජ ෆැසිස්ට්වාදී පාලනය, ජනතා විරෝධී සහ පූර්වසාමූහික ප්‍රතිපත්ති සහ ජනතාව වෙතට මුදා හැරුණු භයංකර හිංසනය සහ මර්ධනය නිසා එය ජනතාවගේ බලවත් කෝපයට සහ වෛරයට පාත්‍ර වූහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2011 මැයි වල ඡන්දයෙන් සම්පූර්ණ පරාජයක් ලදහ.

විප්ලවීය බලවේගයන් එක්සත් කිරීම ඇරඹීම සඳහා පක්ෂය ප්‍රයත්නයන් දරමින් සිටියහ. 1995 දී පැවැත්වූ කලින් මහජන යුද්ධ පක්ෂයේ සමස්ත ඉන්දියා විශේෂ සම්මේලනය 1980 න් පසු ක්‍රියාමාර්ගයන් ගැඹුරින් සමාලෝචනය කළහ. මේ සමාලෝචනය මත පදනම්ව සහෝදර කොටෙස්වාර්ලු විවිධ විප්ලවීය කණ්ඩායම් සහ බලවේග අතර නිර්මාණශීලී ක්‍රියාකාරිත්වයකින් යුතුව සමගි සාකච්ඡා ගෙන ගියහ.

මේ සම්මේලනය යුගය පිළිබඳ ප්‍රශ්නයට අනුව ‘මෙය තවම ලෙනින්වාදී යුගයයි’ තීරණය කළහ. එය මගින් 1977 දී සන්නද්ධ අරගලයෙන් ඉවත් වීමට කතා කිරීම නොකල යුතු බව සහ ඩෙංග් කල්ලියේ තුන්වන ලෝක න්‍යාය මාඕ චින්තනය විකෘති කිරීමක් බව තීරණය කළහ. එය දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව ලෝක ආර්ථිකයේ ඇතිවූ නැගීම් සහ අර්බුද, ක්‍රියාකාරී සහ අක්‍රීය ලෙස මැතිවරණ වර්ජනය ආදී වෙනත් ප්‍රධාන ප්‍රශ්න ගැන පැහැදිලි කිරීමක් ලබා දුන්හ. මතවාදී සහ දේශපාලන ගැටලුවලට (ISSUE) අමතරව මේ සම්මේලනය යුධමය සහ සංවිධානමය ක්ෂේත්‍රයන්හි පක්ෂයේ අත්දැකීම් ද නව දෘෂ්ඨියෙකින් සමාලෝචනය කොට ඉහළ මට්ටමේ අවබෝධයෙකින් යුතුව වර්ධනය කරන ලදි. එය දේශපාලන බලයේ ප්‍රායෝගිකත්වය පිළිබඳ අවබෝධය දියුණු කළ අතර ගරිල්ලා කලාප පිළිබඳව පැහැදිලි බවක් ලබා දුණි.

මධ්‍යම කාරක සභාව SCOMA (යුධ කටයුතු පිළිබඳ උප කමිටුව) සහ SCOPE (දේශපාලන අධ්‍යාපනය පිළිබඳ උප කමිටුව) මේ සම්මේලනයේදී පිහිටුවන ලදි. සහෝදර කොටෙස්වාර්ලුට SCOPE හි වගකීම් ලබා දෙන ලදි. මේ සම්මේලනයෙන් පසුව, කලින් පක්ෂ එකමුතුව සහ මහජන යුද්ධ පක්ෂ අතර සමගි සාකච්ඡා වැඩි කරනු ලැබූහ. සහෝදර කොටෙස්වාර්ලුගේ නායකත්වය යටතේ පක්ෂය විසින් ගනු ලැබූ සමගි ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස බටහිර බෙංගාලය තුළ බොහෝ සංවිධානමය සහ තනි ක්‍රියාකාරකම් 1995 සිට එක්සත්ව ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස් ලෙනින්වාදී) (මහජන යුද්ධය) CPI (ML)(PW) විසින් අරඹන ලදි. පක්ෂ මාවතෙහි දැඩිව පදනම්ව මධ්‍යම කාරක සභාව වෙනුවෙන් සාධනීය වාතාවරණයක් තුළ ඔහු විවිධ විප්ලවීය කණ්ඩායම් සහ ජාතික අරගල සංවිධානයන් අතර ව්‍යක්ත විවාදයක් මෙහෙයවූහ. ඔහු අපේ පක්ෂ දේශපාලනය මගින් බොහෝ පුද්ගලයන් පක්ෂය වෙත ආකර්ෂණය කර ගත්හ. විවිධ බලවේග සහ සංවිධාන අතර චින්තනයන්, ක්‍රියාමාර්ග සහ සංවිධාන සමගිය සාක්ෂාත් කර ගැනීම සඳහා, සහෝදර කොටෙස්වාර්ලු සමගි අරගලය සහ උසස් සමගියක් ඇති කර ගැනීමට වෙහෙස වූහ. මෙය විප්ලවවාදීන් අතර සමගිය ඇති කිරීමට මග පෑදීය.

මේ ක්‍රියාවලියේදී කලින් පක්ෂ එකමුතුව (PU) සහ මහජන යුද්ධය (PW) සමගි ක්‍රියාවලිය ඇරඹූහ. සහෝදරාත්මක වාතාවරණයක් තුළ වසර හතරක සාකච්ඡා වලින් අනතුරුව, 1998 අගොස්තු හිදී මේ පක්ෂ දෙක එක්සත්ව ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස් ලෙනින්වාදී) (මහජන යුද්ධය) CPI (ML)(PW) පිහිටවූහ. පක්ෂ දෙකෙහි එක්සත්වීමෙන් පසු කලින් මහජන යුද්ධ (පක්ෂය) 2001 මාර්තු හිදී එහි 9 වන සම්මේලනය සාර්ථකව පැවැත්වූහ. 30 වසරක හිඩැසකට පසුව ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස් ලෙනින්වාදී) පැවැත්වූ 8 වන සම්මේලනය වූ මෙය ඓතිහාසික සම්මේලනයක් වූහ. මේ සම්මේලනය කලින් මහජන යුද්ධ පක්ෂ මාවත තවදුරටත් සාරවත් කළහ. සංවිධානමය සහ යුධමය ක්ෂේත්‍රයන් ගැන එය ඉහළ අවබෝධයක් ලබා දුන්හ. එය ඉතිරිව තිබෙන විප්ලවීය බලවේග අතර සමගි ක්‍රියාවලිය තීව්‍ර කිරීමට තීරණය කළහ. එම සම්මේලනය විමුක්ති ප්‍රදේශ බිහි කිරීමේ අරමුණ ඇතිව ගරිල්ලා යුද්ධය තීව්‍ර කිරීම, ගරිල්ලා කලාපවල ගරිල්ලා පදනම් (base) බිහි කරමින් විමුක්ති ප්‍රදේශ පිහිටුවීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම, ආත්ම-ආරක්ෂාවේ යුද්ධෝපායික පියවර ලෙස උපායික ප්‍රතිප්‍රහාර ගෙන යාම, ග්‍රාම් රාජ්‍ය කමිටු (GRC), විප්ලවීය ජනතා කමිටු (RPC) ලෙස සංවර්ධනය කරමින් සහ සියළු බලවේගයන් ඒකාග්‍ර කරමින් යුද්ධ ව්‍යාපාරවල ආකාරයෙන් පක්ෂයේ කාර්යයන් ක්‍රියාවෙහි යෙදවීම යන කරුණු සම්බන්ධව නිවැරදි මෙහෙයවීමක් ලබා දුන්හ. නියෝජිතයින් බහුතරය එම සම්මේලනයේදී ඉදිරියට මතු වූ වාම අවධානම්කාරී දෘෂ්ඨිය පරාජය කොට නිවැරදි විප්ලවීය දෘෂ්ඨිය අනුව පසුගිය අත්දැකීම් වඩාත් සඵල කළහ. 1980 දී පසුගිය ක්‍රියාමාර්ගයන් ගැන පක්ෂය කළ සමාලෝචනය පසු විප්ලවීය ක්‍රියාමාර්ගයන් සඳහා පහන් ප්‍රදීපයක් ලෙස සේවය කළ අතර 1995 සහ 2001 දී කරන ලද සමාලෝචනයන් වත්මන් ක්‍රියාමාර්ගය සඳහා වටිනා මග පෙන්වීම් විය. ඒ කාලය වන විට CCOMPOSA (දකුණු ආසියානු පක්ෂ සහ සංවිධානවල සමායෝජන කමිටුව) පිහිටුවනු ලැබීම ප්‍රශංසනීය විය. RIM (විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරය) සමග යහපත් සම්බන්ධතාවයන් පවත්වා ගනිමින් 2001 සම්මේලනය පවත්වන ලදි. MCC (මාඕවාදී කොමියුනිස්ට් මධ්‍යස්ථානය) සමග තිබුණු ගැටුම් නැවතිය යුතු යැයි එම සම්මේලනය දැඩිව කල්පනා කළහ. එම සම්මේලනයේදී මධ්‍යම කාරක සභාවට නැවත වරක් තේරී පත්වුණු සහෝදර කොටෙස්වාර්ලු දේශපාලන මණ්ඩලයට ගනු ලැබූහ. මේ සම්මේලනයෙන් පසු පළමු වතාවට කලාප බියුරෝ පිහිටුවනු ලැබූ අතර මධ්‍යම කාරක සභාව ඔහුට උතුරු බියුරෝවේ (බටහිර බෙංගාලය, බිහාර්, ජාක්හෑන්ඩ්, උත්තර් ප්‍රදේශ්, ඔඩිෂා, දිල්ලි, පන්ජාබ් සහ හර්යානා යන නැගෙනහිර සහ උතුරු ඉන්දියානු ප්‍රාන්ත අයත්වේ) ලේකම් වශයෙන් වගකීම් ලබා දෙන ලදි.

සහෝදර කොටෙස්වාර්ලු කලින් මහජන යුද්ධය (PW) සහ ඉන්දියාවේ මාඕවාදී කොමියුනිස්ට් මධ්‍යස්ථානය (MCCI) අතර එක්සත්කම ඇති කර ගැනීමට සිය පූර්ණ වෑයම යෙදූහ. 2001 සම්මේලන කාලය වන විට කලින් MCCI ඒ වන විටත් ඒක පාර්ශ්වික ගැටුම් අවසන් කිරීමක් ප්‍රකාශ කොට තිබුණු අතර සම්මේලනයෙන් පසුව කලින් PW ය ද ගැටුම් අවසන් කිරීම ප්‍රකාශයට පත් කළහ. මේ සමග ආතතිය ලිහිල් වී ගිය අතර ගැටුම් නැවතිණි. මෙය පක්ෂ දෙක අතර සාකච්ඡා ක්‍රියාදමය ඇරඹීමට මග පෑදූහ. පක්ෂ දෙකම ගැටුම් සමය 'අඳුරු පරිච්ඡේදයක් ලෙස' හඳුනා ගත්හ. කලින් PW හි මධ්‍යම කාරක සභා රැස්වීම 2002 අගදී පැවැත්වුණිණී සමගි සාකච්ඡා සඳහා MCCI කැමති බැවින් සාකච්ඡා ක්‍රියාවලිය වහාම ඇරඹිය යුතු යැයි යන යෝජනාව සහෝදර කොටෙස්වාර්ලු ඉදිරිපත් කළහ. මධ්‍යම කාරක සභාව මේ යෝජනාව බලවත් උද්‍යෝගයෙන් එකහෙලා පිළිගෙන සියළු බලතල සහිත ඉහළ මට්ටමේ ඉහළ බලයක් ඇති නියෝජිතයින් සාකච්ඡා සඳහා තෝරා ගත්හ. සහෝදර කොටෙස්වාර්ලු එහි එක් සාමාජිකයෙකි. 2003-2004 දී පක්ෂ දෙක අතර පියවර 3 කින් පවත්වන ලද ද්විපාර්ශ්වික සාකච්ඡා තුළ සහෝදර කොටෙස්වාර්ලු ප්‍රධාන කාර්යභාරය ඉටු කළහ. මෙහි ධනාත්මක ප්‍රතිඵලය වූයේ 2004 සැප්තැම්බර් 21, ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) CPI (Maoist) බිහිවීමයි. මෙය නක්සල්බාරිවලින් පසු දශක හතරකට ආසන්න දිගු ඉතිහාසීය ගමන් මග තුළ වූ කීර්තිමත් සිදුවීමක් විය. එක්සත් වුණු පක්ෂය සාර්ථකව එහි 9 වන සම්මේලනය 2007 ජනවාරි හිදී පවත්වන ලදි. මේ සම්මේලනයේදී මධ්‍යම කාරක සභාවට තේරී පත්වුණු සහෝදර කොටෙස්වාර්ලු දේශපාලන මණ්ඩලයට ගනු ලැබූහ.

## උතුරු සහ නැගෙනහිර ඉන්දියාව තුළ ව්‍යාපාරය සංවර්ධනය කිරීමට ප්‍රයත්න දැරීම

1993 අග සිට සහෝදර කොටෙස්වාර්ලුගේ විප්ලවීය ජීවිතය ප්‍රධාන වශයෙන්ම ඉන්දියාවේ උතුරු නැගෙනහිර ප්‍රාන්තවල සහ විශේෂයෙන්ම බටහිර බෙංගාලයේ විප්ලවීය ව්‍යාපාරය සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම හා සම්බන්ධව ගතවූහ. 1994 ආරම්භයත් සමග ඔහුගේ ප්‍රධාන ක්‍රියාකාරී ප්‍රදේශය ලෙස බෙංගාලය සකස් කරන

අතරතුර දිල්ලි, හර්යානා, පන්ජාබ් සහ උත්තර් ප්‍රදේශ් තුළද විප්ලවීය ව්‍යාපාරය පුළුල් කිරීමට ඔහු ප්‍රයත්න දැරූහ. 1998 දී පක්ෂ එකමුතුව සමග එක්සත්කම සම්පූර්ණ කරගත් පසු බිහාර්-ජාක්හෑන්ඩ් ප්‍රදේශවලත් විප්ලවීය ව්‍යාපාරය සංවර්ධනය කිරීමට ඔහු යොමුවූහ. අතීතයේ සිට පක්ෂ එකමුතුවේ (PU) නායකත්වය යටතේ දියත් කෙරුණු සන්නද්ධ ගොවි ව්‍යාපාරය ඔහු ගැඹුරින් අධ්‍යනය කොට එය තවදුරටත් උසස් අදියරක් දක්වා වර්ධනය කිරීමට වෙහෙස වූහ. ඔහු එහි ප්‍රාන්ත කමිටු රැස්වීමකට පැමිණියහ, ව්‍යාපාරයේ ප්‍රදේශයන් සංචාරය කළහ, පංති අරගලය තියුණු කොට ගරිල්ලා යුද්ධය දියුණු කිරීමට උචිත මග පෙන්වීම ලබා දුන්හ. ඔහු සාමාජිකයින් වෘත්තීමය විප්ලවවාදීන් ලෙස වාත්තු කොට දිගටම ඔවුන්ව ව්‍යාපාරයට සහ ජනතාවට බද්ධ කොට තැබීමට විශේෂ ප්‍රයත්නයන් දැරූහ. 2004 දී PW සහ MCCI පක්ෂ එක්වීමෙන් පසු, සහෝදර කොටෙස්වාර්ලු මධ්‍යම කාරකසභාවේ සාමාජිකයෙකු ලෙස සහ අළුතින් පිහිටුවනු ලැබූ නැගෙනහිර කලාප බියුරෝවේ සාමාජිකයෙකු ලෙස ප්‍රධාන වශයෙන් උතුරු බෙංගාලය දෙසට සිත් යොමු කළහ.

මේ වගකීම් ඉෂ්ඨ කරන අතර සමහර වෙලාවට ඔහු පක්ෂයේ වගකිවයුතු පුද්ගලයෙකු ලෙස CCOMPOSA ද පවත්වාගෙන ගියහ. සමස්ත ඉන්දියා මට්ටමින් අධිරාජ්‍ය විරෝධී සංවාද මණ්ඩප පිහිටුවීමට ඔහු මග පෙන්වූහ. ඔහු විවිධ ජාතික විමුක්ති සංවිධාන සමග යහපත් සම්බන්ධතාවයන් පවත්වා ගෙන පක්ෂයේ නියෝජිතයෙකු ලෙස ඒවායේ ද්විපාර්ශ්වීය රැස්වීම් වලට සහභාගි වූහ. ඔහු විවිධ විප්ලවීය සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන වලට මග පෙන්වූවා මෙන්ම රට පුරා, ශක්තිමත් අධිරාජ්‍ය විරෝධී, රදළ විරෝධී එක්සත් පෙරමුණුවලට පදනම දැමූහ.

පක්ෂ දෙකේ ඒකාබද්ධ වීමෙන් පසු, රට තුළ අතිශය සතුටුදයක විප්ලවීය පරිසරයක් නිර්මාණය විය. පක්ෂ දෙකේ හමුද එක්වීමෙන් මහජන විමුක්ති ගරිල්ලා හමුදව (PLGA) බිහිවීම පීඩිත ජනතාවගේ උද්‍යෝගය දෙගුණ කළහ. ඒකාබද්ධ වීමෙන් පසු පක්ෂයේ ශක්තිය ඉහළ යෑම ගැන සූරාකන පාලක පංතිය සිත් තැවුලට පත් වූහ. 'වාම අන්තවාදීන් රට තුළ බලවත්ම අභ්‍යන්තර ආරක්ෂක තර්ජනය වේ' යැයි ඔවුහු නින්දිත ප්‍රචාරක කුණාටුවක් මුද හැරියහ. සූරා කන ඉන්දීය පාලක පංතිය ජනතා විරෝධී ප්‍රතිපත්ති කිහිපයක් ඉදිරියට ගෙන එමින් අධිරාජ්‍යවාදී ගෝලීයකරණ ආර්ථික ප්‍රතිපත්තියට දණ්ඩ නමස්කාර කළහ. විශේෂ ආර්ථික කලාප පිහිටුවීම (SEZ) මේවායින් එකකි.

සියළු ප්‍රාන්තවල ජනතාවට SEZ භයංකර සිහිනයක් විය. ප්‍රාන්ත කිහිපයකම රජයන් ගොවියන්ගේ වගා බිම් SEZ සඳහා අත්පත් කර ගත්හ. රටේ ආර්ථිකය සංවර්ධනය වන්නේ යැයි සූරාකන පාලක පංතිය SEZ හි වටිනාකම පිළිබඳව අහසට ආ වැඩූහ. ඔවුන් තමන්ගේ විනාශයට මං පාදන බව වටහාගත් පීඩිත ජනතාව සිංගර් සහ නන්දිග්‍රාම් වැනි ස්ථානවල සටන්කාමී අරගලවල නියැලුනහ. ටාටා සමාගම සිංගර්හි ඉදිකරන්නට අදහස් කළ නැනෝ මෝටර් රථ කර්මාන්තය සහ විදේශීය ආයෝජකයින් වූ ඉන්දුනිසියාවේ සාලෙම් කණ්ඩායම නන්දිග්‍රාම්හි ඉදි කරන්නට අදහස් කළ රසායනික මධ්‍යස්ථානය ට ජනතාව විරුද්ධ වූහ, - මේ දෙකම බටහිර බෙංගාලයේ විය. 'අපේ ජීවිත දුන්නත් අපේ භූමිය නොදෙමු' යන්න ජනතාවගේ රණ හඬ විය. මේ සටන් පාඨය ගත් අපේ පක්ෂය සිංගර් සහ නන්දිග්‍රාම් හි සටන් වදින ගොවියන්ගේ සහය පිණිස නැගී සිටියහ. සහෝදර කොටෙස්වාර්ලු සහ ඔහුගේ අතිමහත් පළපුරුද්ද, මෙවැනි ව්‍යාපාරවලට නායකත්වය දිය හැකි බටහිර බෙංගාල ප්‍රාන්ත කමිටුවට (WBSC) මග පෙන්වූහ. එක්සත් පෙරමුණක කොටසක් ලෙස පිහිටවනු ලැබූ BUPC (ඉඩම් උදුරා ගැනීමට එරෙහි අරගල කමිටුව) සමග ඒකාබද්ධ වූ මහජන සංවිධානවල නායකත්වයෙන් ඔවුන්ගේ ඉඩම් වෙනුවෙන් සටන්කාමී ගොවි ජන අරගල නිර්මාණය කිරීමේදී පක්ෂය සාර්ථකත්වයට පත් වූහ. නන්දිග්‍රාම්හි කාන්තාවෝ ඔවුන්ගේ ඉඩම් වෙනුවෙන් ඔවුන් විසින්ම 'මාතන්ගිනි මහිලා සංගතන්' ලෙස ඒකාබද්ධ වූහ. ජනතාව, විශේෂයෙන්ම තරුණයෝ සමාජ ෆැසිස්ට්වාදී කල්ලිවලට එරෙහිව ඉදිරි පෙරමුණේම සටන් කරමින් සන්නද්ධ විරෝධය පෑම් සඳහා සූදනම් වූහ.



**කුලී හේවායන් ජනතාවට ද්‍රාමරික කම් කරමින් (ලාල්ගාර්හ් වලදී)**

කොම්ප්‍රදෝරු නිලධාරිවාදී ධනපතියන්ට (CBB) සේවය කිරීමට ස්වයංව කැප වී සිටි 'මාක්ස්වාදීහු' සහ ඔවුන්ගේ සහයට සිටි අධිරාජ්‍යවාදීහු ලක්ෂ කෝටි ගණන් විදේශ ආයෝජනයන් වෙනුවෙන් නන්දිග්‍රාම් සොහොන් බිමක් බවට පත් කර ලීමට කිසිම පැකිලීමක් නොවූහ. ඔවුන් විසින් සිදු නොකල එකදු ක්‍ෂුද්‍ර කමක් වත් එහි නොවීය. CPM කල්ලිය කිසිදු පැකිලීමක් නොමැතිව ලජ්ජා සහගත ලෙස ජනතාව සංහාරය කළහ. කාන්තාවන්ට සිදු කළ දමරිකකම් කථා කළ නොහැකි විය. සිය සරුසාර භූමිභාගයන් වෙනුවෙන් අරගලයේ ඉදිරි පෙරමුණේ නැගී සිටි තරුණයන් සහ තරුණියන් කැබලිවලට කපා දමා ඔවුහු ඒවා ඇලවල්වලට දැමූහ. පුද්ගලයින් කිහිප දෙනෙකුගේ මළ සිරුරු අතුරුදහන් විය. දහස් ගණන් වූ ගූන්ඩා වාහිනී (දමරික හමුදවක්) ඒකකය 2007 නොවැම්බර් දී මුළු ප්‍රාන්තය පුරාම ඉහළින්ම මෙහෙයවමින් නන්දිග්‍රාම් අරගලයේ ගිනිදැල්ල නිවා දැමීමට සමූලඝාතනයන් දියත් කරන්නට වූහ. පොලිසිය සතු නවීන රයිෆල් වලින් සන්නද්ධ වූ දමරික කල්ලි සහ තමන්ට අයත් වූ අවි සමග CRP බලඇණි කිසිම වග විභාගයක් නැතිව සටන් කරමින් සිටි ජනතාවට වෙඩි තැබූහ. නමුත් ජනතාව යටත් වූයේ නැත. ශිෂ්‍යයෝ, බුද්ධිමත්තු, කම්කරුවෝ සහ ප්‍රජාතන්ත්‍රවාදීහු නන්දිග්‍රාම් අරගලයට සහය දීම සඳහා ඉදිරියට පැමිණියහ. දිල්ලි ඇතුළු විවිධ ප්‍රදේශ වලින් නන්දිග්‍රාම්වලට පැමිණි ජනතාවාදී බලවේග අරගලය සඳහා ඔවුන්ගේ සහයෝගීත්වය ප්‍රකාශ කොට ජනතාව සමගම සිට ගත්හ. SEZ ට එරෙහි අරගලයේ කොටසක් හැටියට ජනතාව සිංගර් සහ නන්දිග්‍රාම්හි නව ආකාරයේ අරගල කිහිපයකට මුල පිරූහ. ඔවුහු සාමාන්‍ය ආකරයේ විරෝධතාවයේ සිට 'අරන්දන්' (උයන පිහන ඉන්ධන නොදැල්වීම) වැනි සන්නද්ධ ප්‍රතිරෝධයන් පිහිටුවා, සෑම ආකාරයකම අරගලයන් ගෙන ගියහ. නන්දිග්‍රාම්හි ජනතාව දේශීය ගිනි අවි නිෂ්පාදනයට යුධ කම්හල් ඉදි කළහ. ඔවුහු CPM හි සන්නද්ධ දමරික කල්ලි සහ පොලිසිය සහ CRP බල ඇණි සමග මුහුණට මුහුණ ලා සටන් කළහ. නන්දිග්‍රාම් සටන් බිමක් බවට හැරවුණහ. අවසනායේ, බුද්ධදෙව්ගේ වාම පෙරමුණු රජයට නන්දිග්‍රාම් මහජන අරගලය ඉදිරියේ දණ නමන්නට සිදු විය. රසායනික මධ්‍යස්ථානය නන්දිග්‍රාම්වලින් අකුලාගෙන යන්නට සිදු වුණි. ටාටා හි නැනෝ ෆැක්ටරිය සිංගර් වලින් ගුජරාටයට ගෙනයන ලදි. ජනතාව විජයග්‍රාහීන් බවට පත් විය. මේ සාර්ථකත්වය පිටුපස නිර්ධන පංතියේ පෙරමුණු බලඇණියේ ක්‍රියාකාරිත්වය වූ අතර සහෝදර කොටෙස්වාර්ලු එයට නායකත්වය දෙනු ලැබූහ.

නන්දිග්‍රාම් ජනතා අරගලයේ සංවත්සරය සැමරීමේ කාලය වන විට ලාල්ගාර්හ් කැරැල්ල එයට ආවේණික වූ නෛසර්ගික ලක්‍ෂණ සමග ඉදිරියට ආහ. ජින්ඩාල් සිය ආයෝජනයනුත් සමග ලාල්ගාර්හ් වලට ඇතුල් වූහ. බුද්ධදෙව් භට්ටචර්යා සහ රාම් විලාස් පස්වාන් ජින්ඩාල්ට රතු පලස් එළා ආරාධනය කළහ. මධ්‍යම සහ ප්‍රාන්ත රජයන් සිය රාජ්‍ය යන්ත්‍රය ඉහළම ගියරයට දමා ජනතාවගේ දේපළ, විශේෂයෙන්ම ජංගල්මහල් ජනතාවගේ ඛණිජ සම්පත් කොල්ලකන්නට පහසුකම් සැපයූහ. නමුත් ජංගල්මහල් විරෝධය දැක්වූහ. ජනතාවගේ ආයාචනයන්ට කන් නොදීම නිසා ජින්ඩාල්ට ආරක්ෂාව සැපයූ බුද්ධදෙව්ට සහ රාම් විලාස් පස්වාන්ට මහජන විමුක්ති ගරිල්ලා හමුදාවේ බෝම්බ වල රස බලන්නට සිදුවිණි. පසුව පොලිසිය දැඩි මර්ධනයක් ජනතාව වෙතට නිදහස් කළහ, ජනතාව ගේ කෝපය පුපුරා ගිය අතර ශ්‍රේෂ්ඨ කරැල්ල ඇරඹුනහ. නොවැම්බර් 13 ලාල්ගාර්හ් අරගලය ඇරඹුණු දිනය ලෙස ඉතිහාසයේ සනිටුහන් විය.

ලාල්ගාර්හ් අරගලය පුපුරා ඉදිරියට පැමිණි කාලය වන විට ලෝකයේ සහ අපේ රටේ බලවත් ආර්ථික අර්බුදයක් ඇතිවූහ. එක්සත් ජනපදයේ නව අර්බුදයක් වූ, නො ගෙවන ලද නිවාස ණය බුබුල පුපුරා ගියහ. මෙය බලවත් මූල්‍ය අර්බුදයකට මං සැලසූහ. ඉන්දියාව ඇතුළු 'සංවර්ධනය වෙමින් පවතින' රටවල් කිහිපයක ආර්ථිකය අධිරාජ්‍ය වාදීන්ගේ අර්බුද මඩ වගුරෙහි ගිලී අමාරුවෙන් හුස්ම ගත්හ. මේ අර්බුදයෙන් ගොඩ ඒමට නිමක් නොමැති ධනය සහ මූල්‍ය මැදිහත්වීම් අවශ්‍ය විය. ඔවුන්ට නව සම්පත් අවශ්‍ය විය. මේ සෝදිසියේ අංගයක් ලෙස සුර්ජගාර්හ් සිට ලාල්ගාර්හ් දක්වා භූමිය යට වැතිරී තිබුණු සම්පත් කොල්ල කෑම ඔවුන්ගේ ක්‍ෂණික න්‍යාය පත්‍රය විය. නමුත් එම ප්‍රදේශවල මාඕවාදීන් පලවා හරින්නේ නැතිව ඔවුන්ගේ අභිලාෂයට අනුව මේ සම්පත් කොල්ලකෑමට නොහැකි වන බව ඔවුහු තේරුම් ගත්හ. එමනිසා නව මර්ධනයන් සහ සමූලඝාතනයන් සැලසුම් කළහ. පසුව ඔවුහු හරිත දඩයම් මෙහෙයුම නම් බහු දැති ආක්‍රමණය සමග ඉදිරියට ආහ.

## නක්සල්බාරි උරුමය ඉහළින්ම එසවූ ලාල්ගාර්හ් මහජන ව්‍යාපාරයේ නායකයා

21 වැනි ශතවර්ෂයේ පළමු දශකය අවසානයේ 'ලාල්ගාර්හ්' විප්ලවීය ජනතාවගේ ආදරණීය රණ හඬ ලෙස ඉදිරියට ආහ. 2008 අග සිට 2010 අග දක්වා වූ දෙ වසරක කාලයේදී ලාල්ගාර්හ් හැම කෙනෙකු- ගේම මුවග රැඳුණි. එය ලෝකයේ අනෙක් රටවල ජනතාවගේ ගෞරවය දිනා ගත්හ. 'ලාල්ගාර්හ්' නක්සල්බාරි හි උරුමක්කාරයා ලෙස ප්‍රකට වූහ.

ලාල්ගාර්හ් ජනතාව ඔවුන්ගේ ඉඩම් ආරක්ෂා කර ගැනීමට රජය සමග සටන් වැදුණහ. රජයේ ෆැසිස්ට් පොලිසිය වෘක රංචුවක් මෙන් සිය ඉඩම් සඳහා දැඩිව නැගී සිටි ජනතාව පීඩනයට පත් කළහ. මිනීමැරුම් සහ ක්‍රෑරකම් පොලිසියේ දෛනික චර්යාව විය. ජනතාව, ප්‍රධාන වශයෙන්ම සන්තාල් ආදිවාසී ජනතාව 'පොලිස් ක්‍රෑරකම්වලට එරෙහි ජනතා කමිටුව' (PCAPA) පිහිටවූහ. කමිටුවේ නායකත්වය යටතේ ජනතාව දහස් ගණනින් ඒකරාශී විය. ඔවුන්ගේ බිරියන්ට සහ දරුවන්ට හිංසාවන් සහ ක්‍රෑරකම් සිදුකළ පොලිස් නිලධාරීන් ඔවුන්ගෙන් සමාව ගතයුතු බවට ඔවුහු දැඩිව බලකර කියා සිටියහ. ඔවුන්ගේ ගමට පොලිසිය ඇතුල් වීම වැළැක්වීමට ඔවුහු සියළු මාවත් වසා දැමූහ. තරුණ පිරිමි සහ කාන්තාවෝ සෑම මාර්ග පද්ධතියක්ම හෑරූහ. ඔවුහු ගස් කපා බිම හෙළා පාරවල් හරස් කළහ. අරගලය මෙයින් නැවතුනේ නැත. ඔවුහු වඩ වඩා ශක්තිමත් වෙමින් පොලිස් ක්‍රෑරකම් වලට එරෙහිව උචිත ආකාරයෙන් පිළිතුරු දෙමින් සටන් කළහ.



ආදිවාසී තරුණයෙක් පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන.(ලාල්ගාර්හ්)



අපි භූමිය වෙනුවෙන් සටන් කරන්නෙමු. (ලාල්ගාර්හ්)

එම ප්‍රදේශවල මාස ගණනක් තිස්සේ සූරාකන රාජ්‍ය යන්ත්‍රය සම්පූර්ණයෙන්ම නිශ්චලතාවයට පැමිණියහ. ජංගල්මහල් ප්‍රදේශය මෙඩිනිපූර්, පුරුලියා සහ බන්කුරා දිස්ත්‍රික්කවල සීමාවේ වූ වන ප්‍රදේශය විය. එම ප්‍රදේශයේ ගම්මාන සිය ගණනක් යුධ බිමක් බවට පරිවර්තනය විය. ජනතාව එම යුද්ධයේ සොලුදදුවෝ විය. ජනතාවගේ මිලීෂියාව (පුහුණු මහජන හමුදව) ජනතාව අරක්‍ෂා කිරීම සඳහා පියවර ගත්හ. දහස් ගණන් වූ මහජන මිලීෂියාව සන්නද්ධ විය. ශිෂ්‍යයෝ, කාන්තාවෝ, ගොවියෝ සහ තරුණයෝ සිධූ-කානු මිලීෂියාව ආකාරයෙන් ඒකාග්‍ර වූයේ ඒ ශ්‍රේෂ්ඨ ඉතිහාසයේ උරුමකරුවන් විලසිනි. (සිධූ සහ කානු යනු නිදහස් අරගල සමයේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව කැරලි ගැසූ විරෝධාර ආදිවාසී සහෝදරයන්ය.) පොලිස් කෲරකම් වලට එරෙහිව පටන්ගත් අරගලය ක්‍රමයෙන් පීඩිත ජනතාවගේ අව්‍යාජ ආකාරයන් මත පදනම් වූ යුධ අරගලයක් බවට පත් විය. ඔවුහු මිළ ඉහළ යෑමට විරුද්ධවද අරගල කළහ. ඔවුහු තමන්ගේ අස්වනු සඳහා සාධාරණ මිළක් බලකර ඉල්ලා සිටියහ. අධ්‍යාපන ආයතන වලින් පොලිස් කඳවුරු ඉවත් කරවීමට සහ සකසන ලද ව්‍යාජ සටන් (fake encounter) නැවැත්වීමට සහ හරිත දඩයම් මෙහෙයුම අකුලා ගැනීමට ඔවුහු බලකරමින් ඉල්ලා සිටියහ. SEZ ඉදිකිරීම නවතා දැමිය යුතුමයැයි ඔවුහු බල කළහ. පළමුවෙන්ම ඔවුහු සිය මූලික අවශ්‍යතාවයන් වෙනුවෙන් ඉදිරියට ගියහ. එහි වූ මහජන සංවිධාන ජනතාවට අධ්‍යාපනික සහ වෛද්‍ය කටයුතු සැපයීම පමණක් නොව පොදු බෙදහැරීමේ යාන්ත්‍රණය දියුණු කොට එය ඔවුන්ගේ අතට ගත්හ. එතැන් පටන් සමාජ ෆැසිස්ට්වාදීහු 'ජනතාවගේ පාලනය' ප්‍රචාරය කර හැරියේ, තිස් වසරක් අවසන් වී ඇත, පීඩිත ජනතාව විප්ලවීය මාවතක යටතේ තමන්ව පාලනය කිරීමට පටන් ගෙන ඇත. ජනතාව ඔවුන්ගේ විරෝධාර යුද්ධ සහ අද්විතීය කැපකිරීම් හරහා නව ඉතිහාසයක් නිර්මාණය කිරීමට පටන් ගත්හ. මේ සියල්ලටම පිටුපසින් සහෝදර කොටෙස්වාර්ලුගේ මග පෙන්වීම විය.

ජනතාව, තිස් වසරක් තිස්සේ ඔවුන්ට විවිධාකාරයේ හිංසනයන් සහ කෲරකම් සිදුකළ සමාජ ෆැසිස්ට්වාදී අමනයින් පාරට ඇද දැමූහ. මේ අමනයින්ගේ කෲරකම්වල රහස් කුටි වූ ඔවුන්ගේ පක්‍ෂ කාර්යාල, ගඩොලින් ගඩොල ජනතාව අති මහත් කෝපයෙන් යුතුව විනාශකර දැමූහ. වධකා- ගාර වූ මෙම පක්‍ෂ කාර්යාල විනාශ කිරීමට ජනතාව සමූහ වශයෙන් පැමිණියහ. ජනතාව මේ කාර්යාලවලින් විවිධ වර්ගයේ වධ දීමේ උපකරණ සහ තුවක්කු අල්ලා ගත්හ. ජනතාවගේ අධිකරණය සෑම ගමකම කුප්‍රකට දමරිකයින්ට දඬුවම් කළහ. සහෝදර කොටසේවාර්ලු පංතිමය සහ මහජන මාවතට අනුකූලව මේ අධිකරණවලට නියම මගපෙන්වීමක් ලබා දීමට වෙහෙසුණහ. ඒතාක් ගුරුවරයා, ග්‍රාම සාපන්ච්, පන්චායත් ලේකම්, පත්වාරි හෝ පොලීසිය යන CPM (මාක්ස්වාදී ඉන්දියානු කොමියුනිස්ට් පක්‍ෂය - රජය සමග සහයෝගයෙන් වැඩ කරන ජනතා ද්‍රෝහි සංශෝධනවාදී පක්‍ෂයකි) ට අයත් වූ මේ කොයිකත් ජනතාවට වධදෙමින් ඔවුන්ගේ සංස්කෘතිය උදුරා ගත්හ. එබැවින් ජනතාව ඔවුන් ට එරෙහිවත් කැරලි ගැසුහ. එම මහජන අරගලවලට සහභාගි වූ බොහෝ දෙනෙක් මහජන මිලීෂියාවට සහ මහජන විමුක්ති හමුදවට සම්බන්ධ වූහ. ඔවුහු විප්ලවීය දේශපාලනයෙන් සංශෝධනවාදීන්ට එරෙහිව සටන් කළහ. මහජන විමුක්ති හමුදව සහ මහජන මිලීෂියාව මගින් සිය ගණන් ක්‍රියාකාරී වැඩ පහළ විය. මේ සමස්ත ක්‍රියාදමයට සහෝදර කොටෙස්වාර්ලු විසින් දෙනු ලැබූ නායකත්වය විශිෂ්ඨ විය.

කෙටි කාලයක් ඇතුළතදී ලාල්ගාර් ව්‍යාපාරය 1970 වේ විප්ලවීය ප්‍රදේශ වූ සුවර්ණමුක්ති ගං ඉවුරු සහ ගෝපි වල්ලභ්පූර් දිස්ත්‍රික්කයේ මායිම් කරාද ව්‍යාප්ත විය. ලාල්ගාර් කොල්කටාවට ලංවූහ. ලාල්ගාර්හ් අරගලය, දිල්ලි, මුම්බායි, බැංගලෝර් සහ හයිද්‍රාබාද් ඇතුළු බොහෝ නගරවල ශිෂ්‍යයින් සහ බුද්ධිමතුන්, ප්‍රජාතන්ත්‍රවාදීන් සහ අපේක්ෂා සහගත ආදිවාසීන් ආකර්ෂණය කර ගත්හ. චිත්‍රපට නිෂ්පාදකවරු, කවීහු, කලාකරුවෝ සහ මාධ්‍යවේදීහු ලාල්ගාර් වෙනුවෙන් පෙළ ගැසුණහ. එය උතුරු-නැගෙනහිර පෙදෙස්හි සටන් වැදි ජනතාවගේ අවධානය කෙරේ යොමුවූහ. ලාල්ගාර්හ් මහජන අරගලය වෙනුවෙන් සහයෝගිතා කමිටු මුළු රට පුරාම 'ලාල්ගාර්හ් තනි වී නැත, අපි ලාල්ගාර්හ් සමගය' ප්‍රකාශ කරමින් ඉදිරියට එන්නට වූහ. සහෝදර කොටෙස්වාර්ලු මාඕවාදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය අරටුව ලෙස පවත්වාගෙන මේ සහයෝගීතාවයන් ගොඩ නැගීමට ඔහුගේ කාර්යභාරය ඉටු කළහ.

ලාල්ගාර්හ් ජනතා කැරැල්ල අතුගා දැමීමට හර්මාද් වාහිනී, මධ්‍යම සහ ප්‍රාන්ත රාජ්‍ය පොලිස් බල ඇණි සහ කෝබ්‍රා වැනි විශේෂ කොමාන්ඩෝ ගම්මාන සහ වනාන්තර වෙත දහස් ගණනින් යෙදවූහ. ඔවුහු ජනතා ව්‍යාපාරය පාලනය කළහ. ඔවුහු වාහන ගමනාගමනය තහනම් කළහ. ඔවුහු දුම්රිය මාර්ග පෙරළා දැමීම වැනි බිහිසුණු ක්‍රියාකාරකම් දියත් කළහ, බොහෝ මිනිසුන් ගමන් කරමින් සිටියදී මරණයට පත්වීමට මූලික වූ ගනේෂ්වරී දුම්රිය අනතුර සිදු කිරීම වැනි අමානුෂික ක්‍රියාකාරකම් සිදු කළහ, වංශාධිපති මාධ්‍යයන්ගේ උදව් ඇතිව මහා පරිමාණයෙන් විප්ලවීය ව්‍යාපාරය ගැන ව්‍යාජ ප්‍රචාරයන් සිදු කළහ, යටත්විජිතවාදී ප්‍රතිපත්ති ප්‍රකාශ කළහ, සෑම ගමකටම පොලිස් ඔත්තුකරුවන් යොදවා ව්‍යාපාරය ඇතුලට රිංගවා ඒවායේ නායකයින් මරා දැමීමට සැලසුම් කරන ලදි. ස්වදේශ කටයුතු ඇමති චිදම්බරන් සහ ස්වදේශ කටයුතු ලේකම් GK පිල්ලායි ලාල්ගාර්හ් ජනතා ව්‍යාපාරය සහමුලින් වනසා දැමීමට විවිධ කුමන්ත්‍රණ සහ කූටප්‍රයෝග සිදු කළහ. ජනතාව සහ ප්‍රජාතන්ත්‍රවාදීන් වෙනතකට හැරවීමට පාර්ලිමේන්තු සහ ව්‍යවස්ථා රැවටිල්ලෙන් යුතු ඔවුහු සාකච්ඡා සඳහා යෝජනා කළහ. අවම ගැටුම් තීව්‍රතා උපාය මාර්ගයන්හි අංගයක් ලෙස සභ්‍යත්වයේ නාමයෙන් ආර්ථික ප්‍රතිසංස්කරණ පිටාර ගලන්නට විය. මේ සියල්ල 2009 ජුනි සිට උග්‍ර විය. GK පිල්ලායි විවෘතවම නිවේදනයක් කරමින් කියා සිටියේ ලාල්ගාර්හ්, 'හරිත දඩයම් මෙහෙයුමේ' පෙර හුරුවක් බවයි.



ලාල්ගාර්හ් ජනතා රැලියක්

සහෝදර කොටෙස්වාර්ලු සතුරා විසින් සකස් කරනු ලබන මූලෝපායන් සහ උපායන් ට ප්‍රති මූලෝපායන් සහ උපායන් සකස් කිරීමේ සහ සතුරු ආක්‍රමණයන්ට ප්‍රතිපහර දීමට අවස්ථානෝචිත උපක්‍රම අනුගමනය කිරීමේ පළපුරුද්ද ඇතියෙක් විය. ගම්මාන වටේ ආරක්ෂක වළල්ලක් යොදාගෙන සිටි හමාර්ද් කල්ලිය ජනතා අධිකරණයෙන් දඬුවම් ලැබූහ. විවිධ වේශයන්ගෙන් ඔත්තුකරුවන් ජනතාව අතරට යවා තොරතුරු එළිදරවු කරගෙන ඔවුන්ගේ අපරාධ වල ස්වරූපය අනුව දඬුවම් කරන ලදි. ගම්මාන වලට පහරදීමට රහසිගතව පැමිණෙන පොලිස් සහ පැරාමිලිටරි බල ඇණි වලට ජනතාවගේ සන්නද්ධ ක්‍රියාකාරකම් වලින්, බොරු වලවල් සහ බෝම්බ මගින් සුදුසු පිළිතුරු ලබා දෙනු ලැබූහ. සිල්ඩා වලදී සතුරා විසින් ඉදිකරනු ලැබූ අමතර පොලිස් කඳවුරක් විනාශ කිරීමෙන් ජනතාවට සහ ජනතාවගේ පාලනයට රැකවරණය සැලසූ හැටි පෙන්වූහ. සතුරා විසින් ව්‍යාපාරය තහනම් කිරීමට තීරණය කළ විට ව්‍යාපාරය පළල් කිරීමට තීරණය කළහ. ව්‍යාපාරය ලාල්ගාර්හ්, රාම්ගාර්හ්, ධර්මපූරි, කොටිවාලි, මධුපූර්, පලයිබානි, ග්වොල්තෝර්, සාරෙන්ගා, බින්පූර්, ජාර්ග්‍රාම්, ලෝධාසුලි, ගෝපි වල්ලභ්පූර්, නයග්‍රාම් සහ සන්ක්‍රයිල් වලට පුළුල් කළහ. සතුරු බලඇණි අතරම හටගත් ප්‍රතිවිරෝධයන් භාවිතයට ගැනීමට තීරණය කෙරුණි. සතුරු ප්‍රචාරක යුද්ධයට, විප්ලවීය ප්‍රචාරක යුද්ධය මගින් ප්‍රතිප්‍රහාර දීමට බලාපොරොත්තු විය. මේ සඳහා විප්ලවීය සඟරා සහ සාහිත්‍යය මෙන්ම සතුරු හස්තයේ වූ මාධ්‍ය පවා ප්‍රචාරක අවි ලෙස භාවිතා කළහ. සහෝදර කොටෙස්වාර්ලු 1980 දී ඇරඹි, APSC නායකත්වය යටතේ පිහිටුවනු ලැබූ 'උද්ඝෝෂණ හා ප්‍රචාරක කමිටුවේ' (APC) අණ දෙන්නා විය. ඒ දිනවල සිට මේ දක්වා ඔහු උපාය උපක්‍රම සකස් කොට ප්‍රචාරක යුද්ධයට

උචිත වටිනාකමක් ලබාදෙමින් ඒවා නිර්මාණශීලීව ක්‍රියාවට නැංවීය. විප්ලවවාදීන්ට ඔවුන්ටම ආවේණික වූ ප්‍රචාරක යුද්ධයක් තිබිය යුතු බවට ඔහු සිතන්නට පුරුදුව සිටියහ. ඔහු තදින්ම විශ්වාස කළේ මේවා අපේ ගරිල්ලා කලාප තුළ ඔවුන් විසින්ම සපයා ගත යුතු බවයි.

ලාල්ගාර්හ් ව්‍යාපාරයේ විරෝධය පෑමේ ක්‍රියාමාර්ගයන් හි යෙදුණු සහෝදර උමකාන්ත් මහාටෝ, සසාධාර් මහාටෝ, දෙවැනි සිධූ සොරෙන්, සිධූ කානු මිලීෂියාවෙ උත්තරීතර අණදෙන්නා ඇතුළු විප්ලවවාදීහු 160 ක් පමණ වූ මහජන යුද්ධයේ රණශූරයෝ සතුරා සමග වීරෝධාර ලෙස සටන් වැද ආරක්ෂක නිළධාරීන් 70 ක් පමණ සමූලඝාතනය කොට, තවත් 50 කට පමණ තුවාල සිදු කොට අවි 82 අල්ලා ගත්හ. ලාල් මොහාන් තුදු වැනි ලාල්ගාර්හ් ජනතා කැරැල්ලේ නායකයෝ ජනතාවගේ විමුක්තිය උදෙසා ජංගල්මහල්හි සිය රුධිරය වැගිරූහ. සහෝදර කොටෙස්වාර්ලු අරගලයේ මේ සියලු දූ පුතුන් ගෙන් ඉමහත් ප්‍රබෝධයට පත් වී අවසානය දක්වාම ඔවුන් ගිය මාවතේ පිය මැන්නාහ.

## පක්ෂයේ අභ්‍යන්තර අරගලවලදී දැඩි ලෙස නැගී සිටි තිරසර විප්ලවවාදියා

සහෝදර කොටෙස්වාර්ලු විවිධ අවස්ථාවලදී පක්ෂය තුළ පැන නැගි අභ්‍යන්තර අරගලවලදී විප්ලවීය පාර්ශ්වය සමග දැඩි ලෙස නැගී සිට වාම සහ දක්ෂිණ අවස්ථාවාදීන්ට සහ දියකරහැරීම්වාදීන්ට දැඩිව විරුද්ධ වූහ. මතවාදී රණශූරයෙක් ලෙස විවිධ වර්ගයේ සංශෝධනවාදීන්ට සහ අවස්ථාවාදීන්ට ප්‍රතිප්‍රහාර එල්ල කළහ. 1985 දී කලින් මහජන යුද්ධය (PW) (කණ්ඩායම) තුළදී KG සත්‍යමූර්ති වැනි අවස්ථාවාදීන් නිර්මාණය කළ අර්බුදවලට දේශපාලනිකව එරෙහිවී පක්ෂය එක්සත්ව සහ විප්ලවීය මාවතේ දැඩිව තබා ගන්නට ඔහු සිය උපරිම ශක්තිය යෙදූහ. කොන්ඳපිල්ලි සීතාරාමයියාගේ වකවානුවේ අවස්ථාවාදයේ ගොදුරක් බවට තමන්ව පත්කරගත් පක්ෂ ලේකම් 1991 දී තවත් අර්බුදයක් උද්ගත කළහ, සහෝදර කොටන්නා විප්ලවීය පාර්ශ්වය සමග දැඩිව නැගී සිටියහ. මේ අභ්‍යන්තර අරගල නිසා කොන්ඳපිල්ලි සීතාරාමයියා ඇතුළු බන්ඩයියා සහ ප්‍රසාද් පක්ෂයෙන් නෙරපා දැමුණු අතර නව තරුණ නායකත්වය ඉදිරියට ආහ. 1980 දී අන්ද්‍රා ප්‍රදේශ් වල දක්ෂිණ අවස්ථාවාදීන්ට එරෙහි අරගලය, උතුරු බෙංගාලයේ නව සංශෝධනවාදීන්ට එරෙහිව මතවාදී සහ දේශපාලනික අරගලය නොකඩවා ගෙන යමින් බටහිර බෙංගාලයේ ප්‍රාන්ත කමිටුවේ ලේකම් මනික් විසින් ගෙන යනු ලැබූ අවස්ථාවාදී දේශපාලනය පරාජය කිරීම තුළ සහෝදර කොටෙස්වාර්ලු ගේ භූමිකාව අතිශයින් ශ්‍රේෂ්ඨය. බටහිර බෙංගාල ඒකකය තුළ පැන නැගි විවිධ ප්‍රශ්න විසඳීමට පූර්ණ මග පෙන්වීම ලබාදෙමින් ඔහු කටයුතු කළහ. එවැනි මතවාදී අරගල කාලවලදී සහ විවිධ සගරා හරහා පවත්වාගෙන ගිය විවාද, වැනි ඔහුගේ නොයෙක් ක්‍රියාකාරකම් සූත්‍රගත කිරීමේ ලේඛණ වලට සහ කෘතීන්වලට ඇතුල් විය. 2004 දී පක්ෂ දෙකක එක් වීමෙන් පසු බටහිර බෙංගාලයේ සිට පැමිණි කලින් පක්ෂ දෙකේම පක්ෂ නිළයන් අතර ශක්තිමත් සමගියක් ඇති කිරීමට ඔහු බලවත් ලෙස වෙහෙසුණහ. සාමාන්‍යයෙන් සහෝදර කොටන්නාට මතවාදී සහ දේශපාලනික විෂයයන් ගැන හොඳ ග්‍රහණය කිරීමක් තිබිණි ඔහුගේ න්‍යායික අධ්‍යයන කටයුතු නොකඩවා සිදු කරන ගමන් පක්ෂ ක්‍රියාමාර්ගය සංවර්ධනය කිරීමෙහි සහ ආරක්ෂා කිරීමෙහි ලා ඔහු රඟ දැක්වූ භූමිකාව ශ්‍රේෂ්ඨ විය. ඔහු සෑම වර්ගයකම සංශෝධනවාදී මතවාදයන්ට එරෙහිව දැඩිව ප්‍රතිප්‍රහාර එල්ල කළ මාක්ස්වාදී මතවාදී රණශූරයෙකු විය. මේ ගමනේදී අපේ පක්ෂයේ සෑම ලිපි ලේඛණයන් මෙන්ම 'යුද්ධෝපායික සහ උපායමාර්ගික' ලිපි වලින් පොහොසත් කිරීමට ඔහු වෙහෙස නොබලා වැඩ කළහ.

## සහෝදර රම්පී - සෙනෙහසේ, කරුණාවන්තකමේ සහ ප්‍රියමනාප බවේ කැටිවීමකි

සහෝදර රම්පී පක්ෂ නිළයන්ගේ සහ ජනතාවගේ නායකයා පමණක් නොව ආදරණීය සහ අනෙක් අය ගැන සැලකිලිවන්ත පුද්ගලයෙකි. ඔහු සෑම වර්ගයකම සමාජ ස්ථර වලට අයත්, සෑම වයස් පරතරයකම කාන්තා සහ පිරිමි කොයි කාත් සමග එකලෙස මුහුන් විය. හැකි සෑම තැනකදීම සෑම කෙනෙකුටම සිය හද පතුලින්ම හිතෙෂී වීම ඔහුගේ අද්විතීය චරිත ලක්ෂණයකි. ඔහුගේ 38 වසරක දිගු විප්ලවීය ජීවිත කාලය තුළ පක්ෂ කාඩර්වරු දහස් ගණනකගේ ආදරය සහ සෙනෙහස, ඔවුන් සමග වඩවා ගත් අප්‍රමාණ ආදරණීය බැඳීම් මගින් ඔහු දිනාගත්හ. ඔහු කාඩර්වරුන්ගේ අවශ්‍යතාවයන් ගැන සැලකිලිමත් වූවා පමණක් නොව ඒවා වගකීමෙන් යුතුව මතකයේ තබාගෙන ඒවා සපුරාලූහ. ඔහු කාර්යයන් පැවරීමට පුද්ගලයන්ගේ දක්ෂතාවයන් හඳුනාගත්තා පමණක් නොව ඔවුන් වඩාත් නිපුණ කුමන ක්ෂේත්‍ර වලද යන වග හඳුනාගත්හ. ඔහු කොතැනක සිටියත් ඔවුන්ට අවශ්‍ය කරන පොත් පත් ලබා දීමට අවශ්‍ය කරන උදව් ලබා දී වගකීමෙන් යුතුව ඒවා සොයා බැලූහ. ඔහු එය සහෝදරවරුන් මුණ ගැසීමට කාරණයක් කර ගත්හ. ඔහු සමීපව ඇසුරු කරන අයගෙන් සහ ගරිල්ලාවන්ගෙන් මහජන යුද්ධයේ සහ RPC ගැන ඔවුන්ගේ කුඩා පරිමාණ අත්දැකීම් වල තොරතුරු ඇසූහ. ඔවුන්ට ආදරය කරන ඔවුන්ගේ සඳදරණීය දේශපාලන ගුරුවරයා කොයි මොහොතක හෝ තමන්ට මුණගැසී තිබෙන්නට ඇතැයි යන්න සෑම කෙනෙක්ම විශ්වාස කළහ. හැමකෙනෙකුම ඔවුන්ට බොහෝ දෑ ඉගැන්වූ, ඔවුන්ගේ දුබලකම් හඳුනාගත්, යහපත් දෑ වලට දිරි දුන් සහ ඒවාට අනුබල දුන් නායකයෙකු ලෙස ඔහුට ආදරය කරන්නට පෙළඹී සිටියහ. ඔහුට කාඩර්වරු මුණගැසීමට නොහැකි විට ඔහු ඔවුන්ට ලියූහ.

සතුරා සමග සටන් කොට තුවාල ලද සහෝදරවරුන්ට වෛද්‍ය පහසුකම් ලබා දීම කෙරේ ඔහු විශේෂ අවධානයක් යොමු කළහ. ඔවුන් ගේ ශාරීරික තත්ත්වයන්ට ගැලපෙන කාර්යයන් සපයා දීමෙන් සහ දිරිමත් කිරීමේ වදන් වලින් ඔවුන්ගේ ආත්ම විශ්වාසය ඉහළ නැංවීමට ඔහු පුරුදුව සිටියහ. සතුරා සමග වූ කෲර යුද්ධයේදී සිය ජීවන හවුල්කරුවන්ගේ ජීවිත අහිමි වූ සහෝදරවරුන්ගේ දුක බෙද හදගෙන ඔවුන්ගේ කඳුලු පිස දැමූ ඔහු ඔවුන්ට

විප්ලවය, පක්ෂය සහ ජනතාව ගැන විශ්වාසය පවත්වා ගැනීමට කතා කළහ. අද දවස දක්වාම බොහෝ සහෝදරවරුන්ට ඔහු ගේ දිරිය දනවන වදන් මතකයේ රැඳී ඇත! සමහර සහෝදරවරු ඔවුන්ට මතුවී තිබෙන ගැටලු ජය ගැනීමට ඔහුව සිහිපත් කරමින් හෝ නැවත නැවත ඔහුගේ ලිපි කියවමින් සිය විප්ලවීය ජීවය පුරවා ගනිති. පක්ෂයට බැඳුණු දවස්වල සිටම තමාට සමීප වූ හැම කෙනෙක්ම විප්ලවීය ව්‍යාපාරයේ රැල්ල වෙතට රැගෙන ඒමට ඔහු වෙහෙස වූහ. ඔහුගේ බාල සොහොයුරා පවා ඔහු විප්ලවීය කටයුතුවලට යොමු කළහ. සහෝදර රම්පී ඔහුට ධෛර්ය ලබාදී විප්ලවීය ක්‍රියාකාරිකයෙකු සහ නායකයෙකු ලෙස ඔහුව හැඩ සැවූහ. ඔහු 1984 දී විප්ලවීය ව්‍යාපාරයේ පූර්ණ කාලීන සාමාජිකාවක සමග විවාහ විය. ඔහු ඇයට බෙහෙවින් උපකාර කළහ. විප්ලවීය ව්‍යාපාරයේ ප්‍රමුඛ පෙලේ නායිකාවක ලෙස ඇයව සංවර්ධනය කළ ඔහු ගේ දිරිමත් කිරීම ශ්‍රේෂ්ඨ වූහ. පරමාදර්ශී යුවලක් වූ ඔවුහු තමන්ට වූ වගකීම් නිසා එකිනෙකාගෙන් දුරස්ව බෙහෙවින් දුර විසූහ. සතුරාගේ කෲර ආක්‍රමණය හමුවේ ඔවුහු නිතර මුණ නොගැසුණත් විප්ලවයේ ශුභසිද්ධිය වෙනුවෙන් ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දුන්හ. ඔහු පුවත්පත් වලින් ඔහුගේ මවට සහ ඇය වැනි වූ සියලු මවුවරුන්ට ලිපි හරහා විප්ලවීය පණිවුඩයක් ලබා දෙමින් මානුෂික ස්පර්ශයකින් යුතුව ව්‍යාපාරය ගැන ඔවුන්ට පහද දුන්හ.

## කාන්තා සොහොයුරියන්ට සහය පිණිස නැගී සිටි නායකයෙක්

න්‍යායිකව මෙවැනි සූරා කන සමාජයක කාන්තාවන්ට මිනිසුන්ට වඩා අමතර බරක් කර ගසන්ට වෙන බවත් එමනිසා කාන්තාවන්ගේ විමුක්තිය සූරාකෑමෙන් විමුක්තිය ලැබීම හා බැඳී පවතින බව සහෝදර කොටෙස්වාර්ලු විශ්වාස කළහ. සිය දෛනික ජීවිතයේදී සූරාකෑමට එරෙහිව සටන් වදින කාන්තාවන් පීතෘමූලික සංකල්පයන්ට එරෙහිවත් සටන් වැදීම ඔහු බලාපොරොත්තු වූහ. පක්ෂය තුළ කාන්තාවන් මුහුණ දෙන ගැටලු ගැන 1991 දී DKFC වෙනුවෙන් ඔහු මූලිකවම කෙටුම්ලත් කළ ලිපිය හැම විටම අධ්‍යනය කිරීමට සහ ක්‍රියාවට නැංවීමට වැදගත් එකක් විය. ඔහු පක්ෂයටත් කලින් සමාජය තුළදී පීතෘ මූලික පීඩනයෙන්, නිරක්තියෙන් (ලේ අඩුකමින්) සහ ගරිල්ලා ජීවිතයේදී මැලේරියාවෙන් පීඩාවට පත් වූ කාන්තාවන්ට 'විශේෂ ආහාර' ලබා දිය යුතු යැයි යෝජනා කොට ඒ සඳහා අවසර දුන්හ. මෙය ඔහුගේ පෘථුල දර්ශනය විදහා පායි. ඔහු හැමවිටම ඉගැන්වූයේ; පක්ෂය කාන්තාවන් වෙන් වෙන්ව දිරිමත් කළ යුතුයි, පුහුණුවේදී සිදු කරන යුධ අභ්‍යාසවල සිට විප්ලවීය ක්‍රියාකාරකම්වල උසස් වීම් ලබා දෙන විටදී ඔවුන් පරදවනවා වෙනුවට මිනිසුන් සමග තරගකාරී මට්ටමකින් තබා ගත යුතුයි.

දිගු කාලයක් විප්ලවීය ව්‍යාපාරය සමග වැඩ කටයුතු කළ නායකත්වයේ සිටින කාන්තා සහෝදරියන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ඒවා විවිධ පක්ෂ සඟරා වල පළ කිරීම ගැන සහෝදර රම්පී විශේෂ අවධානයක් යොමු කළහ. ව්‍යාපාරය තුළ ඔවුන්ගේ මෙම අත්දැකීම් බෙද දීම පාඨකයන්ට සහ පක්ෂය තුළ වැඩ කරන කාන්තා සහෝදරියන් දිරිමත් කරනු ලැබීමට ප්‍රයෝජනවත් විය.

## සතුරාට එරෙහිව සිය හඬ සහ පෑන මෙහෙයවූ රණශූරයෙක්

සහෝදර කොටෙස්වාර්ලු ලියන්නේ හෝ කතා කරන්නේ මොනවාද ඒවා ආශ්වාදජනක ඒවා වීම ඔහුගේ චරිතයේ වූ සුවිශේෂත්වයකි. ඔහු ගේ පෑන බොහෝ ව්‍යක්ත කවි පබැඳූහ. ඔහු සංවේදී මිනිසෙක් විය, ඔහුගේ ප්‍රතිචාර භාවාත්මක විය. දෛනික වැඩවලදී හඳුනා ගත් දෙය නම් සෑම පීඩනයක්ම මැඩගෙන ඔහු විවේකය රහිතව වැඩ කළහ. වැඩ කිරීමේදී ඔහු හැමවිටම ප්‍රමුඛයා විය. ඔහුගේ අනික් සගයින්ගෙනුත් ඔහු එයම බලාපොරොත්තු වූහ. ඔහු සහෝදරවරුන්ගේ දක්ෂතා, හැකියාවන් සහ සම්පූර්ණ ශක්තිය එළියට ගෙන ඒවා ව්‍යාපාරය සඳහා යෙදවීමට පොළඹවමින් දිරිමත් කළහ. ඔහු ලිවීමෙහි යෙදීම මෙන්ම අනික් සහෝදරවරුන් ලියන ලද දේ සකස් කිරීමද සිදු කළහ. ඔහු ලිවීම්වල අඩුපාඩු පෙන්වා දුන්හ, විවේචනය කළහ, දිරිමත් කළහ. මෙය සහෝදර රම්පීගේ සුවිශේෂී චරිත ලක්ෂණයකි. විශේෂයෙන්ම ඔහු කාන්තා සහෝදරියන් ලේඛකයන් බවට වර්ධනය කිරීම සඳහා දිරිමත් කොට ඔවුන්ට යෝජනා ලබාදී, උදව් සිදු කළහ. ඔහු දුසිම් ගණන් කවි ලියුහ. ඔහුගේ කවි අතර මස් මරන්නාගේ සිනහව, දිය පහරවල්, දුනු සහ ගෝදවරී සොයා ගැනීම අපහසු නොවේ.

කරිම්නගර් හිදී සහෝදර ජාපා ලක්ෂමා රෙඩ්ඩි පොලීසිය විසින් ඝාතනය කළ මොහොතේ 'පුතෙක්' නමින් ඔහු ලියූ දිගු කවි පංතිය ඔවුන් අතර වූ ගැඹුරු බැඳීම පෙන්නුම් කළහ. 1984 දී ගෑඩ්චිරෝලි වල පැවැත්වුණු කම්ලපූර් සම්මේලනයට ගොස් එන අතරතුරදී, ඔහු පළමුවරට ගරිල්ලාවන්ගේ විවාහ උත්සවයකට සහභාගි වූහ. ජනතාවගේ ප්‍රතිචාර ඇසීමෙන් පසු ඔහු ලියූ කවිය ජනතාව සහ ගරිල්ලා භටයන් අතර වූ බැඳීම විස්තර කළේය. ඔහු සහභාගිවන රැස්වීම්වල සාකච්ඡාවලට ගන්නා අන්තර්ගතයන් ගැන කවි පබැඳීමට ඔහු සතු සුවිශේෂී දක්ෂතාවයක් විය. මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය CPI (Maoist) පිහිටුවීම සැමරීමේදී ඔහු හිට්වන කවි කිහිපයක් මගින් අනෙක් අය උද්‍යෝගයට පත් කළහ. 2008 අවසානයේදී ඔහු දන්දකර්ණයා වල සංචාරය කොට ජංගල්මහල් වලට එන අතරතුරේදී 'දැව ඉනි' (Wooden Stake) යන නමින් කාව්‍යයක් නිර්මාණය කළහ (විමුක්ති මහජන භටයින් විසින් අතුරනු ලැබූ දහස් ගණන් බොරු වලවල් ගැනයි, ඒවා සකස් කර තිබුණේ ලී ඉනි භාවිතා කරමිනි). ජනතාවගේ විරෝධය දැක්වීමේ අරගලයෙන් ඔහු ආශ්වාදය ලැබූ හැටි මෙයින් පෙනේ. ඔහු සහෝදරවරුන්ට ලිවීමේදී ඇතිවී තිබෙන ක්ෂණික තත්ත්වය විස්තර කොට සහ ඔවුන් අතර තිබූ බැඳීම ඉස්මතු කරමින් ක්ෂණික කවි ගණනක්ම ලිපි වලට ඇතුල් කළහ. ඔහුගේ සහෝදරවරු 'අත් දෙකෙන්ම කවි ලියන කවියෙක්' යැයි ඔහුට විහිළු කරන්නට පුරුදුව සිටියහ. ඔහුගේ ලිපි වල තැන් තැන්වල තිබූ කාව්‍ය බෙදුම්, නව සාහිත්‍යය යෙදුම් සහ

වාක්‍යයන් ඒවා කියවන්නන්ට සිත්ගන්නා සුළු විය. සහෝදරවරු ඔහුගේ ලිපි මහාර්ඝ දෑ ලෙස ආරක්ෂා කරගෙන තිබෙන්නේ ඒ නිසාවෙනි.

1984 දී අලකුරපාදු හිදී පැවැත් වූ විප්ලවීය ලේඛකයන්ගේ සංගමයේ (RWA) වැඩමුළුවකදී වරින් වර විප්ලවීය ලේඛකයන්ගේ කාර්යභාරය සිහිපත් කරමින් යෝජනා සහ අදහස් ඔවුන් සමග බෙදා හදා ගත්හ. ඔහු දන්දකර්ණයාවල ගරිල්ලා ලේඛකයින් දිරිමත් කොට, එම ලේඛකයින්ගේ සඟරාව වූ 'ජන්කාර්' ට මාර්ගෝපදේශනය ලබා දුන්හ. ඔහු විවිධ අන්වර්ථ නාම වලින් ලියූහ. පසුව ඔහු ස්ථිරවම භාවිතා කළ නම වුයේ 'අසිධාරා' ය.

ඔහු පක්ෂය සඳහා බොහෝ දේ ලියූහ. විවිධ ප්‍රකාශන ලියමින් සිය ප්‍රතිචාර දැක්වීම ඔහු සතු විශේෂඥතාවකි. ඔහු පක්ෂයේ සඟරාවලට පමණක්ම ලියුවේ නොවේ, ඒවා ධනේශ්වර මුද්‍රිත මාධ්‍යය කරාද යැවීය. විප්ලවීය ව්‍යාපාරයේ සහ පක්ෂයේ සතුරන්ට සහ ව්‍යාජ විප්ලවවාදීන්ට ඔහු ප්‍රති උත්තර සැපයූහ. විප්ලවීය සඟරා පවත්වාගෙන යෑමේ අතිමහත් රුචියක් ඔහු ට විය. සහෝදර කොටෙස්වාර්ලු ලෙනින්ගේ ඉගැන්වීමක් වූ 'සඟරාවක් සංවිධායකයෙකි' යන්න ඔහුගේ ජීවිත කාලය පුරාවටම භාවිතාවේ යොදා වඩා උසස් ලිපි ලේඛණ වලින් යුත් සඟරා පළ කිරීමට මහත් වැදගත්කමක් ලබා දුන්හ. ඔහු ක්‍රාන්ති, රැඩිකල් මාර්ච්, කාර්මිකා, පතාම්, ප්‍රභාත්, වැන්ගාඩ්, අවම් ජුන්ග් යන සඟරා පවත්වාගෙන යෑමට ප්‍රමුඛ ලෙස වැඩ කළහ. උතුරු බෙංගාලයේ විප්ලවීය සඟරා කීපයක් අරඹා ඒවා පවත්වාගෙන යෑම සඳහා ඔහු ලබා දුන් මාර්ගෝපදේශකත්වය අති විශිෂ්ඨය. ව්‍යාපාරයේ අවශ්‍යතාවයන්ට අනුව ඔහු මතවාදීමය, දේශපාලනමය, සංවිධානමය, යුධමය, සංස්කෘතික සහ සමාජමය කාරණාවන් ගැන අධ්‍යයනය කොට සිය ගණන් ලිපි ලියූහ. දන්දකර්ණයාවල ක්‍රමය අනුව සඟරාවන් ප්‍රදේශයේ ජනතාවගේ භාෂාවන්ගෙන් ගෙන යා යුතු බව ඔහු කල්පනා කළහ. පොත් පළ කිරීම සඳහාත් ඔහු මහත් වූ අවධානයක් යොමු කළහ. 1980 දී හයිද්‍රාබාද්හි සාම පොත් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ ඔහුගේ වෑයම අමතක කළ නොහැකිය.

සහෝදර කොටෙස්වාර්ලු දක්ෂ කථිකයෙකි. ඕනෑම විෂයක් ගැන ඔහුට චතුර ලෙස කථා කළ හැකි විය. තෙලංගානා භාෂාව භාවිතයේදී ඉතා සියුම් වෙනසකින් යුතුව රසාත්මක ආකාරයකට කථා කිරීමට ඔහු පුරුදුව සිටියහ. ඔහු සංචාරය කරන ප්‍රදේශවල භාෂාවෙන් කථා කිරීමට ඔහු උත්සාහ කළහ. ව්‍යාපාරයේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා ඔහු කෝයා, හින්දි, ඉංග්‍රීසි සහ බංගලා භාෂාවන් උගත්හ. ඔහුගේ කථාවන් ශ්‍රාවකයන්ගේ අවබෝධය ඉහළ නැංවූ අතර ඔවුන්ව උද්‍යෝගයට පත් කළහ.

සහොදර කොටෙස්වාර්ලු 2007 සිට නැගෙනහිර කලාප බියුරෝවේ මාධ්‍ය ප්‍රකාශක විය. පසුව ලාල්ගාර්හ් ව්‍යාපාරයේ මහා ප්‍රවාහයත් සමග ඔහු දිගටම මාධ්‍ය සමග සම්බන්ධව විවිධ ගැටලු ගැන පක්ෂයේ ස්ථාවරය ප්‍රකාශ කළහ. මාධ්‍ය සමග ඔහු යහපත් සම්බන්ධතාවයන් පවත්වා ගත්හ.

## කාඩර්වරු වාත්තු කළ මාක්ස්වාදී ගුරුවරයා

සහෝදර කොටෙස්වාර්ලු දැරූ තවත් එක් වැදගත් වගකීමක් වූයේ කාඩර්වරුන්ගේ අධ්‍යාපනයයි. අරම්භක දවස්වල ඔහු කාඩර්වරුන්ට දේශපාලන පංති පවත්වා ඔවුන්ගේ සංවර්ධනය සඳහා බලවත් වෙහෙසක් දැරූහ. ඔහු 1966 දී SCOPE සහ මධ්‍යම දේශපාලන පාසලේ වගකීම් කරට ගත් පසු නායකත්ව කාඩර්වරුන් සඳහා ක්‍රියාමාර්ග සැලසුම් කොට සූත්‍රගත කළහ. ඔහු ගුරුවරුන් සමග තෝරාගත් මාතෘකාවලට සටහන් සැකසීම සඳහා දායක වූහ. ඔහු යන්නේ කොතැනටද කාඩර්වරුන්ගේ මට්ටම අනුව මාතෘකා තෝරා ගැනීම ගැන, සටහන් සකස් කිරීම, පන්ති පැවැත්වීම සහ ඉගැන්වීම ගැන අත්‍යවශ්‍ය යෝජනා ඉදිරිපත් කරයි.

පරිශෝධන ව්‍යාපාරයේදී ප්‍රමුඛස්ථානය ගෙන නැගීසිටි සහෝදර කොටෙස්වාර්ලු ඔහුගේ වැරදි නිවැරදි කරගෙන පරමාදර්ශයක් ගොඩ නැගූහ. 1984 දී ප්‍රාන්ත ලේකම් වශයෙන් පක්ෂයේ වැරදි ප්‍රවණතාවයන් 6 ක් නිවැරදි කරගැනීමේ දී ඔහුගේ වැරදි හඳුනාගත් ඔහු අවංකවම ස්වයං විවේචනයක් ඉදිරිපත් කර ලේකම් තනතුරින් ටිකක් පසුපසට ගියහ. ප්‍රාන්ත ලේකම් කාර්යාලයේ සාමාජිකයෙකු වශයෙන් සිට ඔහු ගේ වැරදි ජයගැනීමට අවංකවම වෙහෙස දැරූ ඔහු කෙටි කළකින් ම හැම දෙනෙකු ගේම ප්‍රශංසාවට පාත්‍ර වූහ. ඔහු පක්ෂ කමිටු රැස්වීම් වළදී ඔහුගේ සම සහෝදරවරුන් විසින් ඉදිරිපත් කළ විවේචන සහ යෝජනා ගැඹුරින් අවබෝධ කරගැනීමට පුරුදුව සිටියහ, ඒවා නායකත්ව මට්ටමට ගැලපෙන සේ සකස් කරගෙන මුළු පක්ෂයටම ආදර්ශයක්

ලෙස සේවය කළහ. ඔහු සිය සම සහෝදරවරුන්ට ඉගැන්වීමට පුරුදුව සිටියේ සෑම කෙනෙක්ම වැරදි කරයි, නමුත් ඒවා හඳුනාගෙන නිවැරදි කරගැනීම කොමියුනිස්ට්වාදීන්ගේ ශ්‍රේෂ්ඨත්වයයි. දිනපතා නිවස පිරිසිදු කිරීම, අයෙකුගේ මුහුණ පිරිසිදු කිරීම සහ පූර්වෝපායක් වශයෙන් එන්නත් කිරීම වගේ ස්වභාවයක් වශයෙන් විවේචනය සහ ස්වයං විවේචනය ඉගැන්වූ සහ ක්‍රියාවට නැංවූ කොමියුනිස්ට් ගුරුවරයෙකි ඔහු.

## අයෙකු දිවි පිදූ විට දහස් ගණන් ඔහුගේ ස්ථානය ගැනීමට පැමිණෙයි

සහෝදර කොටෙස්වාර්ලු තව දුරටත් නොමැත. ඔහු බහුවිධ දක්ෂතාවයන්ගෙන් යුත් අයෙකු වූහ. ඔහුගේ දිවි පිදීමත් සමග ශ්‍රේෂ්ඨ මිනිසෙක් අපට අහිමි විය. ඔහු කාඩර්වරුන්ගේ ආදරණීය නායකයායි. ඔහු මතවාදී,

දේශපාලනික සහ සංවිධානය කිරීම යන විෂය ක්ෂේත්‍රයන්හි අපරිමිත අත්දැකීම් සම්භාරයකින් යුත් බුද්ධිමතෙකි. සිය ගිනි අවිය කිසිද බිම නොතැබූ ඔහු කවියෙකු, විප්ලවීය ලේඛකයෙකු, සොල්දාදුවෙකු සහ මහජන යුද්ධයේ අණදෙන්නෙකු විය. වසර 38 ක් තිස්සේ දිවා සහ රාත්‍රී දෙකෙහිම විප්ලවය වෙනුවෙන් වැඩ කිරීමෙහි යෙදුණු ඔහු මහජන ව්‍යාපාරවලට සහ මහජන යුද්ධයට නව අත්දැකීම් බෙද දුන්හ. ජගිත්යාල් සිට ජංගල්මහල් දක්වා විප්ලවයේ ගින්න පැතිරවූ ඔහු කුඩා ගිනි පුපුරකින් පතන් ගින්නක් අවුළුවන බව ඔප්පු කළ කොමියුනිස්ට් විප්ලවවාදියෙකු විය. ඔහු ශ්‍රේෂ්ඨ සිහින දකින්නෙකු විය. ඉන්දියානු විප්ලවයේ උදෑසන හිරු මෙන් සහෝදර කොටෙස්වාර්ලු බැබැළුනහ. ඔහු, අනාගත පරපුරට ආදර්ශයක් වූ අපේ කාලයේ ශ්‍රේෂ්ඨ නායකයෙකු විය.

අව්‍යාජ විප්ලවීය බලවේගයන් එක්සත් කරමින්, දශක හතරකට ආසන්න කාලයක් තිස්සේ වෙන්ව සිටි ප්‍රවාහයන් දෙකක් 2004 සැප්තැම්බර් 21 දී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ලෙස එක්සත් විමෙන් පසු අපේ පක්ෂය සැබෑ ශ්‍රේෂ්ඨත්වයට පත් විය. ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ වසර 85 ක පැරණි ඉතිහාසය තුළ, නක්සල්බාරි අරගලයෙන් පසු වසර 45 ක පැරණි ඉතිහාසය තුළ පක්ෂය බොහෝ බෙදීම්වලට ලක්විය. මේ අර්බුදය තුළ විප්ලවය ඉතිහාසයේ කුණු කූඩයට වීසි කොට ඇතැයි යන පාවාදීම කිරීමෙන් විවිධ පුද්ගලයෝ සහ කණ්ඩායම් ද්‍රෝහීන් බවට හැරුණි. නමුත් අපේ පක්ෂය වේගයෙන් අව්‍යාජ විප්ලවවාදීන් එක්සත් කිරීමෙන් දීප්තිමත් ඉතිහාසයක් නිර්මාණය කළහ. දිගු කාලයක් තිස්සේ විප්ලවීය ව්‍යාපාරයට නායකත්වය දෙන විප්ලවීය පක්ෂයක් ලෙස එය ලෝක සම්භාවනාවට පාත්‍ර වී ඇත. අපේ පක්ෂයේ ආරම්භක නායකයින් වූ, අපේ ශ්‍රේෂ්ඨ ගුරුවරුන් වූ දිවි පිදූ සහෝදරවරු වන චාරු මජුම්දර් සහ කන්හයි චටර්ජී දහස් ගණන් සහෝදරවරු විප්ලවීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට දිවි පුදමින් සිටී. එවැනි ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් ඇති අපේ පක්ෂය ඒකාන්තයෙන්ම දිවි පිදූවන්ගේ සිහින සහ අරමුණු සත්‍යය බවට පත් කරවනු ඇත. ජයග්‍රාහීව ඉන්දියානු නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට මග පෙන්වන එය ඒකාන්තයෙන්ම පීඩනයෙන් සහ සූරාකෑමෙන් තොර සමාජයක් ගොඩ නැගීමට මග පෙන්වනු ඇත.

සහෝදර කොටෙස්වාර්ලුගේ ජීවිත ඉතිහාසය වරක් කථා කරන්නට සිදු වන විට, ශ්‍රේෂ්ඨ නක්සල්බාරි සහ ශ්‍රිකාකුලම් ව්‍යාපාරයන්ගෙන් පසු ව වූ පසුගිය දශක හතරක කාලය තුළදී ඒවායේ ඉදිරි ගමන ලෙස සැලකෙන කරිම්නගර්-අදිලබාද්, උතුරු තෙලංගානා, දන්දකර්ණයා සහ බටහිර බෙංගාල ව්‍යාපාරයන් ඇතුළු සමස්ත ඉන්දියානු විප්ලවීය ඉතිහාසය ගැන කථා කරන්නට සිදු වේ. විප්ලවීය අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා සිය ජීවිතය පුද කළ ඔහු ජනතාවගේ නායකයෙකි. ඔහුගේ අභීත ජීවිත පරිත්‍යාගය ඉන්දියානු විප්ලවීය ඉතිහාසය තුළ ලෙයින් ලියැවෙනු ඇත. වැඩවසම් ක්‍රමය, කොම්ප්‍රදෝරු නිළධාරිවාදී ධනේශ්වර ක්‍රමය සහ අධිරාජ්‍යවාදී ක්‍රමය සමග තීරණාත්මකව සටන් කොට ඒවා වළලා දැමීමෙන් මේ ශ්‍රේෂ්ඨ රණශූරයාට සැබෑ ගෞරවය පුද කළ හැකිය. ජාත්‍යන්තර නිර්ධන පංතියේ මේ මාහැඟි පුත්‍රයාගේ අරමුණු ඉෂ්ඨ සිද්ධ වන තෙක් අවසානය දක්වා සටන් වදින බව අපි දිවුරා ප්‍රකාශ කර සිටිමු. අපි දෙගුණ කරන ලද උද්යෝගයෙන් සහ බොල්ෂෙවික්වාදී ජීවගුණයෙන් සංතෘප්තවී ඔහුගේ ස්මරණයේ සහ පරමාදර්ශවල ශක්තියෙන් වැඩට බසිමු. අපි මහජන ව්‍යාපාර සහ මහජන යුද්ධය තීව්‍ර කිරීමෙන් ඔහුගේ දිවි පිදීම නිසා පක්ෂයට සහ සමස්ත ඉන්දියානු විප්ලවීය ව්‍යාපාරයට සිදුවූ අතිමහත් පාඩුව පුරවා ගැනීමට නිමක් නොමැති කොටෙස්වාර්ලුන් නිර්මාණය කරමු. ජනතාව සහ ජනතා ව්‍යාපාරයෝ සහෝදර කොටන්නාට උපත ලබා දී තිබේ. ඒ ජනතාව සහ ජනතා ව්‍යාපාරයෝ ඔහුව නැවත නැවතත් බිහි කරනු ඇත. අතිමහත් පීඩිත ජනතාවගේ හදවත් තුළ ඔහු සදකල් රැඳෙනු ඇත.

2012 ජනවාරි 1

_NMSG_ පරිවර්තනයකි
# 22

slmarxist@ymail.com
slmarxist.yolasite.com